

# දැක්ම

බොදු පිලිවෙත් සුරකින දැහැමි සමාජයක් කරා.......

# මෙහෙවර ප්‍රකාශය

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, ප්‍රවර්ධනය හා කර්තව්‍යයන් මැනවින් සංවිධානය කරලීම තුලින් ,දේශීය හා විදේශීය බෞද්ධ ජනතාවගේ ප්‍රබෝධයට හේතු වන දැහැමි ගුණගරුක සමාජයක් බිහි කර ආදර්ශමත් බෞද්ධ සමාජයක අඛණ්ඩ පැවැත්ම සාක්ෂාත් කරලීම.

# අරමුණු

- ථෙරවාදි බුදුදහම ආරක්ෂා කිරිම.
- සාංඝික දේපල සුරක්ෂිත කිරිම, සංවිධානය කිරිම හා ඒවා සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහාම යෙදවීම.
- බෞද්ධ සාරධර්ම අගයන ගුණගරුක නිර්මාණශීලී ජන සමාජයක් ඇති කිරිම.
- බුද්ධ ශාසනය හා අනාදිමත් කාලෙක සිට බැදුණු අනෙකුත් මතවාදයන් කාලීන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි පවත්වා ගෙන යාම, පෝෂණය කිරිම හා වර්ධනය කිරිම.
- බෞද්ධ සාහිත්‍ය හා කලා ශිල්ප සංරක්ෂණය කිරිම, පෝෂණය කිරිම හා වර්ධනය කිරිම.
- සංවිධානාත්මක හා නූතන තාක්ෂණයට අනුකූල බෞද්ධ ආර්ථිකයක් ගොඩනැගීම සඳහා බෞද්ධ ජනතාව පෙලගැස්වීම හා මෙහෙයවීම.

# පටුන


දැක්ම, මෙහෙවර ප්‍රකාශය සහ අරමුණු I

බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවිඩය IV

හැඳින්වීම V

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන VI

දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව හා සේවයේ නියුතු සේවක සංඛ්‍යාව VIII

**01.** පාලන අංශය **09 - 13**

01.1. 2018 වර්ෂයේ දී පාලන අංශයෙන් සිදුකළ සුවිශේෂී කාර්යයන්

**02.** විහාර දේවාලගම් අංශය **14 - 18**

02.1.විහාරස්ථාන ලියාපදිංචි කිරීම.

02.2.විහාරස්ථාන හා දේවාල සතු ඉඩම් බදු දීම.

02.3.අපවත් වූ ස්වාමීන් වහන්සේලා සතුව තිබූ බැංකු මුදල් නිදහස් කිරීම.

02.4.විහාරස්ථාන හා දේවාල සන්තක ඉඩම් වල ගස් කැපීමට හා විකිණීමට අනුමැතිය දීම.

02.5.පූජා ඔප්පු සඳහා නිර්දේශ ලබා දීම.

02.6.භික්ෂූන් වහන්සේලා විසින් පෞද්ගලිකව මිලදීගත් දේපල සඟ සතු නොවන බව දැනුම් දීම.

02.7.ආරණ්‍ය සේනාසන ඉදිකිරීමට අනුමැතිය ලබා දීම.

02.08.භාරකාර පත්වීම් සිදු කිරීම හා සිද්ධස්ථාන කටයුතු සම්බන්ධව කටයුතු කිරීම.

**03.** දහම් පාසල් අංශය **19 - 27**

03.1.දහම් පාසල් ලියාපදිංචිය.

03.2.දහම් පාසල් ශ්‍රේණි විභාග පැවැත්වීම.

03.3.දහම් පාසල් ගුරු සිසු තොරතුරු රැස්කිරීම හා පවත්වාගෙන යාම.

03.4.123 වන දහම් පාසල් දිනය සැමරීම.

03.5.ගුරුභවතුන් සඳහා ගුරු දීමනා, නිලඇඳුම් ලබාදීම.

03.6.දහම් පාසල් ගුරු සහතිකපත්‍ර විභාගය

03.7.දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම.

03.8.දහම් පාසල් පෙළපොත් මුද්‍රණය කිරීම.

03.9.බුද්ධ ජයන්ති පොත්හල පවත්වාගෙන යාම.

**04.** සංවර්ධන අංශය **28 - 43**

04.1. සිල් මැණියන් වහන්සේලා සම්බන්ධ කටයුතු කිරීම.

04.2 කලා ශිල්ප සහ බෞද්ධ විද්වතුන්ට උපහාර පිදීම.

4.3. දහම් පාසල් සඳහා පහසුකම් සැපයීම.

04.4 විහාරස්ථ කාර්ය සාධක සමිති දායක සභා හා විහාරස්ථ ශාසනාරක්ෂක මණ්ඩල ලියාපදිංචි කිරීමේ කටයුතු

04.5 ශාසනාරක්ෂක මණ්ඩල කටයුතු ප්‍රවර්ධනය කිරීම.

04.6 ජාතික උත්සව සංවිධානය කිරීම.

4.7 උපසම්පදා උත්සව සංවිධානය කිරීම.

4.8 ආදාහන පූජෝත්සව ආධාර ලබාදීම.

4.9 සිවිපස ආධාර ලබා දීම.

4.10 විහාරස්ථාන සඳහා දුරකථන විදුලිය හා ජලය සහනදායී පදනම මත ලබා දීම.

**05.** ව්‍යාපෘති අංශය **44 - 48**

05. 1. දහම් පාසල් ගුරු කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන

05. 2. දහම් සරසවි ඩිප්ලෝමා පාඨමාලාව

05. 3. සංක්ෂිප්ත තිපිටක ග්‍රන්ථ සම්පාදනය හා මුද්‍රණය

05. 4. බෞද්ධ විශ්ව කෝෂය

05. 5. දහම් පාසල් ගුරු හැඳුනුම්පත් සැකසීම.

**06.** **භික්ෂු ලියාපදිංචි අංශය** **49 - 51**
06.1. සාමණේර / උපසම්පදා සහතික නිකුත් කිරීම සහ භික්ෂු හැඳුනුම්පත් ලබා දීම.
**07.** **තොරතුරු අංශය** **52 - 56**
07.1. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීම.
07. 2. විහාරස්ථාන තොරතුරු පරිගණක ගත කිරීම.
07.3. විහාරස්ථාන තොරතුරු යාවත්කාලීන කිරීම.
07.4. පාලි භාෂා ප්‍රවර්ධන වැඩසටහන
07.5. භික්ෂු පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.
07.6. මාධ්‍ය සම්බන්ධ කටයුතු කිරීම.
07.7. දිනපතා බෞද්ධ පුවත්පත් වාර්තා රැස් කිරීම.
**08.** **ගිණුම් අංශය** **57 - 60**
**09.** **අභ්‍යන්තර විගණන අංශය** **61 - 65**
**10.** **බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශිය කාර්යාල** **66 - 77**
10.1.රත්නපුර ප්‍රාදේශිය කාර්යාලය
10.2.මහනුවර ප්‍රාදේශීය කාර්යාලය

# බෞද්ධ කටයුතු  කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව බුද්ධ ශාසනය රැක ගැනීම, පෝෂණය කිරිම, ප්‍රවර්ධනය කිරිම හා සංවර්ධනය කිරිමේ භාරදූර රාජ්‍ය වගකීම බුද්ධ ශාසන අමාත්‍යාංශයේ බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. එම උදාර වගකීම ඉටු කිරිම සදහා මනා දැක්මකින් යුතුව කටයුතු කිරිමට සෑම විටම බෞද්ධ කටයුතු පිළිබද දෙපාර්තමේන්තුව ක්‍රියා කිරිම සතුටට කරුණකි.

අපගේ දැක්ම වනුයේ බොදු පිළිවෙත් සුරකින සමාජයක් ගොඩනැගීමයි. එකී අරමුණ සාක්ෂාත් කර ගැනීම උදෙසා විවිධ කාර්යයන් හා වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. රටක සංවර්ධන ක්‍රියාවලියේදී සිදුවන සමාජ, ආර්ථික හා භෞතික දියුණුවට සමාන්තරව ඒ රට තුල ආධ්‍යාත්මික දියුණුවක් ඇති නොවන්නේ නම් පූර්ණ සංවර්ධනයක් අපේක්ෂා කළ නොහැකිය. එබැවින් මෙම දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනුයේ ඉතා අගනා කාර්යභාර්යකි .


එය ආධ්‍යාත්මික සංවර්ධනය ඇති කිරිම සදහා ගමත් පන්සලත් අතර සබදතාව ශක්තිමත් කරමින් දහම් අධ්‍යාපනය වැඩිදියුණු කිරිමත්, මත්ද්‍රව්‍ය, මත් වතුර හා දුම්වැටි භාවිතය පිටු දැකීමත්, සාරධර්ම ප්‍රවර්ධනයත්, බෞද්ධ ඉගැන්වීම භාවිතයට හුරු කරවිමත් වෙනුවෙන් ඇප කැපව කටයුතු කිරිම අපගේ ප්‍රමුඛ කාර්යයයි.

විහාර දේවාලගම් පනත යටතේ පැවරී ඇති නෛතික කාර්යභාරය අප්‍රමාදව ඉටුකිරිමත්, දහම් පාසල්, සංවර්ධන, ව්‍යාපෘති, තොරතුරු, පාලන, ගිණුම්,අභ්‍යන්තර විගණන හා භික්ෂු ලියාපදිංචි යන අංශ වල සේවාවන් කාර්යක්ෂම හා ඵලදායි ලෙස ඉටුකිරිම සදහා පර්යේෂණාත්මක නවතාවයකින් යුතුව ඉටු කිරිමට කැප වී ක්‍රියා කල සියලු අංශ භාර මාණ්ඩලික නිලධාරින් ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තූති පූර්වක ප්‍රණාමය පුද කරමි.

සුනන්ද කාරියප්පෙරුම,
බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්.

# හැඳින්වීම

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් සම්බුද්ධ ශාසනයේ චිරස්ථිය සඳහා සහ දැහැමි බොදු සමාජයක් පවත්වා ගෙන යාමට අදාල කාලීන ව්‍යාපෘතීන් රාශියක් ඉටු කරන අතරම, 1931 අංක 19 දරණ විහාර දේවාලගම් අඥා පනතින් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත පැවරි ඇති වගකීම් වන බෞද්ධ සිද්ධස්ථාන හා දේපළ සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහාම යෙදවීමට අවශ්‍ය පරිපාලන සහය ලබා දීම, විහාරස්ථාන සංවර්ධය කිරිම, දහම් පාසල් අධ්‍යාපනය වැඩිදියුණු කිරීම හා දිවයිනේ සියලුම සාමණේර/උපසම්පදා භික්ෂූන් ලියාපදිංචි කර ලේඛන පවත්වා ගෙන යාම සිදු කරනු ලබයි.




මෙම කාර්යයන් සාර්ථකව ඉටු කිරිම සඳහා බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ පහත දැක්වෙන අංශ ඇති අතර, එම අංශ වෙත අදාළ කාර්යයන් පවරා ඇත.

විහාර දේවාලගම් අඥා පනතට අදාල කටයුතු දුර බැහැර සිද්ධස්ථානවාසි ස්වාමීන් වහන්සේලාට ඉටු කර ගැනීම පහසු කරනු වස් මහනුවර ප්‍රාදේශිය කාර්යාලය හා රත්නපුර ප්‍රාදේශිය කාර්යාලය ස්ථාපිත කර පවත්වා ගෙන යනු ලබයි.

බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, උන්නතිය හා ප්‍රවර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන වැඩසටහන් මෙම දෙපාර්තමේන්තුව මගින් පවත්වා ගෙන යනු ලැබේ.


01. ශාසනාරක්ෂක මණ්ඩලය පවත්වා ගෙන යාම හා ක්‍රියාත්මක කිරිම.
02. දහම් පාසල් කටයුතු
    i. දහම් පාසල් පොත් මුද්‍රණය කර බෙදා හැරීම.
    ii. දිවයින පුරා දහම් පාසල් ශ්‍රේණි විභාග පැවැත්වීම.
    iii. දහම් පාසල් සිසු කුසලතා ඇගයීමේ වැඩසටහන් ප්‍රාදේශිය, දිස්ත්‍රික් හා සමස්ත ලංකා මට්ටමින් පැවැත්වීම.
    iv. දහම් පාසල් ගුරුවරුන්ගේ අධ්‍යාපන තත්ත්වය නගා සිටුවිම සඳහා දහම් ගුරු සහතික පත්‍ර විභාගය පැවැත්වීම.
    v. දහම් පාසල් ගුරුවරුන් සඳහා නිලඇඳුම් ලබා දීම.
    vi. දහම් පාසල් ගුරුවරුන් සඳහා පුස්තකාල දීමනා ලබා දීම.
    vii. දහම් පාසල් ගුරුවරුන් සඳහා හැඳුනුම්පත් සකස් කිරිම.
    viii. දහම් පාසල් ගුරුවරුන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම.
    ix. දහම් පාසල් ගොඩනැගිලි සඳහා අධාර ලබා දීම.
    x. දුෂ්කර දහම් පාසල් සඳහා උපකරණ ලබා දීම.

xi. අඛණ්ඩව දීර්ඝ කාලයක් සේවයේ යෙදී ඇති දහම් පාසල් ගුරු භවතුන්ගේ සේවාව අගය කර සහතිකපත් ප්‍රදානය කිරීම.
xii. දහම් පාසල් ගුරුවරුන්ගේ පාලි භාෂා දැනුම වර්ධනය කිරීම සඳහා පාලි භාෂා ප්‍රවර්ධන පන්ති පවත්වා විභාගය පැවැත්වීම.
xiii. අඩු අධ්‍යාපන මට්ටමක් සහිත දහම් පාසල් ගුරුවරුන්ට උසස් දහම් අධ්‍යාපනයක් ලබා දීම සඳහා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයත් සමගත් බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයත් සමගත් ඒකාබද්ධ ව දහම් සරසවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

03. ආයතනයේ අරමුණු සඵල කර ගැනීම සඳහා සම්බන්ධීකරණ කටයුතු කරමින් දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සම්බන්ධ පරිපාලන කටයුතු ,ආයතන කටයුතු ,ගොඩනැගිලි නඩත්තුව, තැපැල සම්බන්ධ රාජකාරි හා වාහන සම්බන්ධ රාජකාරි ඉටුකිරීම.
04. ආයතනයේ වියහියදම් හි පාලනය කරමින් වැය ශීර්ෂය වෙත ලබා දෙන මුදල් අදාල කාර්යයන් සඳහා වියදම් කිරීම, ඒ සම්බන්ධ ගණන් පෙන්වීම, වැටුප් ගෙවීම ආදි මූල්‍ය හා ගිණුම් කටයුතු ඉටුකිරීම.
05. විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තියේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් පාලනය යටතේ පවත්නා බෞද්ධ සිද්ධස්ථාන වලට බස්නායක නිලමේවරුන් / භාරකරුවන් පත් කිරීම හා ඔවුන්ගේ පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීම.
06. බෞද්ධ සිද්ධස්ථාන වල දේපල පරිපාලනයට අවශ්‍ය සහය ලබාදීම.මෙහිදි සිද්ධස්ථාන සන්තක ඉඩම් දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දී එම සිද්ධස්ථාන වලට ආදායම් ලබා ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා දීම, සහ සතු නිශ්චල දේපළ වල සුරක්ෂිත භාවය සඳහා කටයුතු යෙදීම, සිද්ධස්ථාන සන්තක දේපළ වල ආරවුල් නිරවුල් කිරීමට මැදිහත් වීම ආදී කාර්යයන් ඉටු කිරීම.
07. දිවයිනේ සියළුම විහාරස්ථාන බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම හා විහාරධිපති තනතුරු පිළිගැනීම.
08. විහාරස්ථාන ආධාර, සිවුපස ආධාර, ආර්ථික දුෂ්කරතා පවතින විහාරස්ථාන සඳහා ආධාර කිරීම.
09. ප්‍රාදේශිය ශාසනාරක්ෂක මණ්ඩල පිහිටුවීමට අදාල කටයුතු.
10. ස්වාමීන් වහන්සේලාගේ ආදාහන කටයුතු සඳහා ආධාර කිරීම.
11. නිදහස් දිනය, වෙසක් දිනය, පොසොන් දිනය සැමරීම සඳහා විවිධ කාර්යයන් ඉටු කිරීම.
12. විහාරස්ථාන කාර්ය සාධක සමිති ලියාපදිංචි කිරීම.
13. විහාරස්ථාන සඳහා සහන ගාසතු මත දුරකථන, ජලය, විදුලිය, වැනි පහසුකම් ලබා දීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දිම.
14. නිකාය හා නිකාය පාර්ශවයන් පිළිබඳ කටයුතු.
15. කුල දරුවන් පැවිදි කිරීම හා උපසම්පදා කිරීම.
16. නිකාය මූලස්ථාන සඳහා ගෙවීම් කටයුතු (රියදුරු/කම්කරු)
17. ලේඛකාධාර යටතේ පොත් මිලදී ගැනීම් කටයුතු.
18. දසසිල් මාතාවන් පිළිබඳ කටයුතු
   i. ආරාම ලියාපදිංචි කිරීම.
   ii. හැඳුනුම්පත් නිකුත් කිරීම.
   iii. අධ්‍යාපන ආයතන සම්බන්ධ කටයුතු.
   iv. රැස්වීම් පිළිබඳ කටයුතු හා සංඝමිත්තා ගුණ සැමරුම.
19. භික්ෂුන් වහන්සේලාගේ සාමණේර හා උපසම්පදා ලියාපදිංචිය.
20. බෞද්ධ භික්ෂුන් වහන්සේලාගේ හැඳුනුම්පත් සකස් කිරීම.
21. විහාරස්ථාන සතු දේපල හා බැංකු ගිණුම් වල ඇති මුදල් සම්බන්ධ කටයුතු.

ඉහත කාර්යයන්ට අමතරව වාර්ෂික පවත්වන ජාතික නිදහස් දින උත්සවය, රාජ්‍ය වෙසක් උත්සවය, වාර්ෂික සිසු නිපුණතා තරග පැවැත්වීම, සංඝමිත්තා පෙරහැර හා සංඝමිත්තා ගුණානුස්මරණ උලෙළ පැවැත්වීම බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මගින් නොකඩවා සිදු කරනු ලබන විශේෂ වැඩසටහන් ලෙස සඳහන් කල හැකිය.


# බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන



## 2018/ 12/ 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව හා සේවයේ නියුතු සේවක සංඛ්‍යාව

| අංකය | තනතුර | වැටුප් කේත අංකය | සේවය | සේවා ශ්‍රේණිය | පන්තිය/ ශ්‍රේණිය | අනුමත සේවක සංඛ්‍යාව | | | සේවයේ නියුතු නිලධාරී සංඛ්‍යාව | | | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ස්ථිර | කොන්ත්‍රාත් | දෛනික | ස්ථිර | කොන්ත්‍රාත් | දෛනික | |
| 01 | බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් | SL 3-2016 | ශ්‍රී.ලං.ප.සේ | ජ්‍යෙෂ්ඨ | විශේෂ | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 02 | බෞද්ධ කටයුතු කොමසාරිස් | SL 1-2016 | ශ්‍රී.ලං.ප.සේ | ජ්‍යෙෂ්ඨ | I | 2 | 0 | 0 | 2 | 0 | 0 | 0 |
| 03 | ප්‍රධාන ගණකාධිකාරී | SL 1-2016 | ශ්‍රී.ලං.ග.සේ | ජ්‍යෙෂ්ඨ | I | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 04 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | SL 1-2016 | ශ්‍රී.ලං.ග.සේ | ජ්‍යෙෂ්ඨ | I | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 05 | නියෝජ්‍ය/සහකාර කොමසාරිස් | SL 1-2016 | ශ්‍රී.ලං.ප.සේ | ජ්‍යෙෂ්ඨ | II/ III | 4 | 0 | 0 | 3 | 0 | 0 | 1 |
| 06 | ගණකාධිකාරී | SL 1-2016 | ශ්‍රී.ලං.ග.සේ | ජ්‍යෙෂ්ඨ | II/ III | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 07 | නීති නිලධාරී | SL 1-2016 | දෙපාර්තමේන්තුගත | ජ්‍යෙෂ්ඨ | III | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 08 | ප්‍රධාන කර්තෘ | SL 1-2016 | කොන්ත්‍රාත් | ජ්‍යෙෂ්ඨ | | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 |
| 09 | උප කර්තෘ | SL 1-2016 | දෙපාර්තමේන්තුගත | ජ්‍යෙෂ්ඨ | | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 10 | නියෝජ්‍ය/සහකාර කර්තෘ | SL 1-2016 | කොන්ත්‍රාත් | ජ්‍යෙෂ්ඨ | | 0 | 2 | 0 | 0 | 2 | 0 | 0 |
| 11 | පරිපාලන නිලධාරී | MN 7-2016 | රා.ක.ස.සේ | තෘතියික | අධි | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 12 | ව්‍යාපෘති නිලධාරී | MN 4-2016 | ආශ්‍රිත නිලධාරී | ද්විතියික | | 2 | 0 | 0 | 1 | 0 | 0 | 1 |
| 13 | බෞද්ධ කටයුතු සමායෝජක | MN 4-2016 | ආශ්‍රිත නිලධාරී | ද්විතියික | | 453 | 0 | 0 | 418 | 0 | 0 | 35 |
| 14 | සංවර්ධන සහකාර | MN 4-2016 | ආශ්‍රිත නිලධාරී | ද්විතියික | | 38 | 0 | 0 | 36 | 0 | 0 | 2 |
| 15 | ගිණුම් සහකාර | MN 4-2016 | ආශ්‍රිත නිලධාරී | ද්විතියික | | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 16 | සහකාර නීති නිලධාරී | MN 4-2016 | ආශ්‍රිත නිලධාරී | ද්විතියික | | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 17 | සංවර්ධන නිලධාරී | MN 4-2016 | සං.නි.සේ | ද්විතියික | | 235 | 0 | 0 | 204 | 0 | 0 | 31 |
| 18 | රාජ්‍ය කළමනාකරණ සහකාර | MN 2-2016 | රා.ක.ල.සේ. | ද්විතියික | I/ II/III | 45 | 0 | 0 | 38 | 0 | 0 | 7 |
| 19 | රියදුරු | PL 3-2016 | ඒ.රි.සේ | ප්‍රාථමික | | 12 | 0 | 0 | 11 | 0 | 0 | 1 |
| 20 | බංගලා භාරකරු | PL 2-2016 | දෙපාර්තමේන්තුගත | ප්‍රාථමික | | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 21 | කාර්යාල සේවක සේවය | PL 1-2016 | කා.සේ.සේ | ප්‍රාථමික | I/ II/III | 20 | 0 | 0 | 18 | 0 | 0 | 2 |
| 22 | ලොරි සහායක | PL 1-2016 | දෙපාර්තමේන්තුගත | ප්‍රාථමික | | 2 | 0 | 0 | 0 | 0 | 0 | 2 |
| 23 | බංගලා භාරකරු සහායක | PL 1-2016 | දෙපාර්තමේන්තුගත | ප්‍රාථමික | | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 24 | මුරකරු | PL 1-2016 | දෙපාර්තමේන්තුගත | ප්‍රාථමික | | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 25 | උපස්ථායක | PL 1-2016 | දෙපාර්තමේන්තුගත | ප්‍රාථමික | | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 26 | ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක සහායක | PL 1-2016 | දෙපාර්තමේන්තුගත | ප්‍රාථමික | | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| එකතුව | | | | | | **829** | **3** | **0** | **744** | **3** | **0** | **85** |

# පාලන අංශය


සහකාර කොමසාරිස්
පරිපාලන නිලධාරි
ප්‍රධාන කළමණාකාර සහකාර
සංවර්ධන නිලධාරි 03
රාජ්‍ය කළමණාකාර සහකාර 09
කාර්යාල කාර්යසහයක 02

දෙපාර්තමේන්තුව තුළ ඇති පාලන අංශය මඟින් විශාල කාර්ය භාරයක් ඉටු කරනු ලබන අතර ඒවා අතරින් ප්‍රධාන කාර්යයන් කිහිපයක් පහත පරිදි සඳහන් කළ හැකිය.

**පෞද්ගලික ලිපිගොනු සම්බන්ධ කටයුතු**

- ❖ දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම.
- ❖ වැටුප් වර්ධක ලබා දීම.
- ❖ නිලධාරීන්ගේ දේපල ණය ලබා දීම සඳහා නිර්දේශ ලබා දීම.
- ❖ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි වීම.

**ප්‍රවාහන කටයුතු**

- ❖ වාහන අලුත්වැඩියාව.
- ❖ වාහන සේවා කිරීම.
- ❖ රාජකාරි කටයුතු සඳහා වාහන යෙදවීම.
- ❖ වාහන රක්ෂණය කිරීම.
- ❖ ධාවන සටහන් පොත් පරීක්ෂා කිරීම.
- ❖ ආදායම් බලපත්‍ර ලබා ගැනීම.
- ❖ වාහන සඳහා ඉන්ධන යෙදීම.

**ආයතනික කටයුතු, පැමිණීම/පිටවීම**

- ❖ දෙපාර්තමේන්තුවට අයත් නව තනතුරු ඇති කිරීම.
- ❖ නිලධාරීගේ පැමිණීම් පිටවීම් පරීක්ෂා කිරීම.
- ❖ නිලධාරීන්ගේ නිවාඩු සම්බන්ධ රාජකාරි කටයුතු ඉටු කිරීම.
- ❖ දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම
- ❖ අතිකාල වලට අදාල වවුචර් භාර ගැනීම හා අනුමත කිරීම.
- ❖ ගමන් වියදම් වලට අදාළ වවුවර භාර ගැනීම හා අනුමත කිරීම.
- ❖ නිලධාරීන් විසින් ලබා ගන්නා විදේශ නිවාඩු සම්බන්ධ රාජකාරි කටයුතු ඉටු කිරීම.
- ❖ නිලධාරිනීන්හට ප්‍රසූත නිවාඩු ලබා දීමට අදාල රාජකාරි කටයුතු
- ❖ සංවර්ධන නිලධාරි තනතුර සඳහා බඳවා ගන්නා ලද නිලධාරීන්ගේ පරිවාස කාලය අවසන් වීමෙන් පසු නිලධාරීන් සේවයේ ස්ථිර කිරීම
- ❖ බෞද්ධ විශ්ව කෝෂයේ උප කර්තෘ තනතුර සඳහා උසස් කිරීමේ පටිපාටියක් සකස් කිරීම
- ❖ කණිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම.
- ❖ පරිගණක යතුරු ලියන සම්බන්ධ රාජකාරි
- ❖ රාජකාරි කටයුතු සඳහා විදෙස් රටවලට යන නිලධාරීන්ට විදෙස්ගතව සිටි කාලයට අදාලව දීමනා ලබා දීම.
- ❖ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම් හා පාඨමාලා සඳහා යොමු කිරීම හා වැඩමුළු පැවැත්වීම.
- ❖ ජල, විදුලි, දුරකථන,පුවත්පත් බිල්පත් පියවීම සම්බන්ධ සියළුම රාජකාරි.
- ❖ තැපැල සම්බන්ධ සියළුම රාජකාරි.
- ❖ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධ සියළුම පරිපාලන කටයුතු.
- ❖ බඳවා ගැනීම, බඳවා ගැනීම් පරිපාටි සකස් කිරීම, කාර්ය මණ්ඩලයේ වෙනස්වීම් යාවත්කාලීන කිරීම, පාර්ලිමේන්තු වාර්තා සැකසීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම ආදී සියළුම ආයතනික කටයුතු.
- ❖ නිලධාරීන්ගේ විනය සම්බන්ධ රාජකාරි කටයුතු.
- ❖ ආපදා ණය සහ දේපළ ණය අනුමත කිරීම.
- ❖ නිලධාරීන්ගේ ස්ථාන මාරු හා අනුයුක්ත කිරීම් සම්බන්ධ සියළුම කටයුතු.
- ❖ නිලධාරීන්ගේ අග්‍රහාර රක්ෂණයට අදාළ කටයුතු.
- ❖ පරිපාලනයට අදාළව වෙනත් ආයතන සමඟ ගනුදෙනු කිරීම.

නඩත්තු කටයුතු

- ❖ දුරකථන, පරිගණක, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර සහ වායු සමීකරණ යන්ත්‍ර ඇතුළු සියළුම උපකරණ නඩත්තු කිරීම.
- ❖ ගොඩනැගිලි නඩත්තු සහ අලුත්වැඩියා කිරීම (මහනායක චාරිකාරාමය, මහනුවර ප්‍රාදේශීය කාර්යාලය සහ රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය)
- ❖ මාණ්ඩලික නිලධාරී, ශාඛා ප්‍රධානී රැස්වීම් පැවැත්වීම.
- ❖ දිස්ත්‍රික් බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරී කළමනාකරණ රැස්වීම් පැවැත්වීම හා ඊට අදාළ කටයුතු.
- ❖ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා අනෙකුත් සියළුම චක්‍රලේඛ පවත්වා ගෙන යාම හා ඊට අදාළ කටයුතු මෙහෙයවීම.
- ❖ මැතිවරණ රාජකාරි සඳහා නිලධාරීන් යොමු කිරීම සම්බන්ධ කටයුතු
- ❖ රාජකාරි හැඳුනුම්පත් සකස් කිරීම.
- ❖ කණිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් ලබා දීම.
- ❖ යතුරු රාජකාරි පැවරීම.
- ❖ කාර්ය මණ්ඩලය ප්‍රතිසංවිධානය කිරීම
- ❖ දෙපාර්තමේන්තුව මගින් පවත්වන රැස්වීම් කැලැන්ඩරට සකස් කිරීම.

## 01.1. 2018 වර්ෂයේ දී පාලන අංශයෙන් සිදුකළ සුවිශේෂී කාර්යයන්

1. රා.ප.ච. 03/2016 අනුව දෙපාර්තමේන්තුවට අනුයුක්ත සියළුම නිලධාරීන්ගේ වැටුප් 2018.01.01 දිනට හා 2019.01.01 දිනට පරිවර්තනය කිරීම.
2. 2018 වර්ෂය සඳහා සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්ට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට අනුයුක්තව සේවය කරන බෞද්ධ කටයුතු සමායෝජක, සංවර්ධන සහකාර, සංවර්ධන නිලධාරී තනතුරු වලට අයත් නිලධාරීන් සඳහා ස්ථාන මාරු ලබා දීම සඳහා අවශ්‍ය නිර්ණායක සකස් කිරීම හා ඒ අනුව ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම හා ඒ අනුව ස්ථානමාරු සිදු කිරීම.
3. රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය මගින් අනුයුක්ත කරන ලද උපාධිධාරී අභ්‍යාසලාභීන් ස්ථිර පත්වීම් ප්‍රදානයෙන් පසු දිස්ත්‍රික්/ ප්‍රාදේශීය කාර්යාලයන්ට අනුයුක්ත කිරීම.
4. 1999 හා 2005 වර්ෂයේ උපාධිධාරීන්ට රැකියා ලබා ගැනීමේ වැඩසටහන යටතේ මෙම දෙපාර්තමේන්තුවට බඳවා ගන්නා ලද නිලධාරීන්, සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය කිරීමට අදාල කටයුතු සිදු කිරීම.
5. දෙපාර්තමේන්තුවට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීම.
6. බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන් සඳහා කාර්යාලීය ගමන් මළු ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
7. දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර දුරකථන සම්බන්ධතාවයේ අලුත්වැඩියා කටයුතු සිදු කිරීම.
8. නීති නිලධාරී කාර්යාලය දෙවන මහලේ ස්ථාපනය කිරීමට කටයුතු කිරීම.
9. මෙම දෙපාර්තමේන්තුව යටතේ පවතින බෞද්ධ විශ්වකෝෂයේ සම්පාදන කටයුතු සිදු කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ කර්තෘ තනතුරු 03ක් බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට හැකි විය. ඒ සම්බන්ධ බඳවා ගැනීමේ කටයුතු සඳහා අයදුම්පත් කැඳවීම, ගැසට් පත්‍රයේ සහ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පල කිරීම හා සුදුසු පුද්ගලයන් තොරා අදාල පත්වීම් ලබාදීම.


10. දෙපාර්තමේන්තුවේ වාහන සංචිතය පවත්වා ගෙන යාම, ඒවායේ අලුත්වැඩියා කටයුතු සහ ප්‍රවාහනය සම්බන්ධ කටයුතු සිදු කිරීම.

2018.12.31 දිනට දෙපාර්තමේන්තුවේ වාහන සංචිතය පහත පරිදි වේ.

- වෑන් රථ - 04
- ලොරි රථ - 03
- කාර් රථ - 03
- කැබ් රථ - 02

11. දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ හිමිකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර දීම සහ නිලධාරීන් අග්‍රහාර රන් සහ රිදී යෝජනා ක්‍රම සඳහා ලියාපදිංචි කටයුතු සිදු කිරීම.
12. මහානායක චාරිකාරාමය කටයුතු පවත්වාගෙන යාම
13. දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ආපදා ණය ලබා දීමට කටයුතු කිරීම.
14. 2017 කාර්යසාධන වාර්තාව භාෂාත්‍රයෙන් සකස් කිරීම හා මුද්‍රණය කිරීම.
15. දෙපාර්තමේන්තුවේ නිළධාරීන්හට පෞර්ෂත්ව හා නායකත්ව පුහුණු වැඩසටහනක් රන්ටැඹේ වනජීවී භාරයේ දී පැවැත්වීම.

# විහාර දේවාලගම් අංශය



සහකාර කොමසාරිස්
ශාඛා ප්‍රධාන 01
සංවර්ධන නිළධාරි 07
රාජ්‍ය කළමනාකාර සහකාර 04
කාර්යාල කාර්ය සහයක

1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතින් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීම විහාර දේවාලගම් අංශයට පැවරී ඇති අතර එමගින් බුද්ධ ශාසනයේ අභිවෘද්ධිය හා චිරස්ථිතිය තහවුරු වී ඇත.

## 02.1. **විහාරස්ථාන ලියාපදිංචි කිරීමග**

1. විහාරස්ථාන ලියා පදිංචි කිරීම සඳහා ලැබී ඇති ඉල්ලුම් පත් සංඛ්‍යාව = 631
2. ලියාපදිංචි කර ඇති විහාරස්ථාන සංඛ්‍යාව = 551
3. මහානායක ස්වාමීන් වහන්සේලා විසින් නිකුත් කරනු ලබන විහාරධිපති ධූරය තහවුරු කිරීමේ ලිපිය පිළිගත් බව දන්වා යැවූ ලිපි සංඛ්‍යාව = 353

## 02.2. **විහාරස්ථාන හා දේවාල සතු ඉඩම් බදුදීම**

1. බදු අයදුම් පත් ලැබී ඇති සංඛ්‍යාව = 595
2. බදු ලබාදී ඇති සංඛ්‍යාව = 135
3. බදු මුදල් සංශෝධනය කර ඇති සංඛ්‍යාව = 53

## 02.3. **අපවත් වූ ස්වාමීන් වහන්සේලා සතුව තිබූ බැංකු මුදල් නිදහස් කිරීමග**

1. අදාළ මුදල් නිදහස් කරන ලෙස ඉල්ලීම් කර ඇති ප්‍රමාණය = 93
2. අදාළ ඉල්ලීම් සඳහා මුදල් නිදහස් කරන ලෙස ලබාදුන් නිර්දේශ මත නිදහස් කර ඇති මුදල් ප්‍රමාණය රුපියල් = 32,901,821.06

## 02.4. **විහාරස්ථාන හා දේවාල සන්තක ඉඩම්වල ගස් කැපීමට හා විකිණීමට අනුමැතිය දීම**

1. ගස් කැපීමට අනුමැතිය ඉල්ලීමේ ලිපි ලැබී ඇති ප්‍රමාණය = 44
2. ගස් කැපීමට අනුමැතිය ලබාදී ඇති ප්‍රමාණය = 44

## 02.5. **පූජා ඔප්පු සඳහා නිර්දේශ ලබා දීම**

1. පූජා ඔප්පු ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇති ප්‍රමාණය = 27
2. පූජා ඔප්පු සඳහා නිර්දේශ ලබාදී ඇති ප්‍රමාණය = 17

## 02.6. **භික්ෂූන් වහන්සේලා විසින් පෞද්ගලිකව මිළදීගත් දේපල සඟසතු නොවන බව දැනුම් දීම**

1. අදාළ ස්වාමීන් වහන්සේලාගෙන් ඉල්ලීම් ලිපි ලැබී ඇති ප්‍රමාණය = 47
2. අදාළ දේපල සඟ සතු නොවන බව දැනුම් දී ඇති ප්‍රමාණය = 32

## . 02.7. **ආරණ්‍ය සේනාසන ඉදිකිරීමට අනුමැතිය ලබාදීම**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම් වල ආරණ්‍ය සේනාසන ඉදිකිරීමට භික්ෂූන් වහන්සේලා විසින් ඉල්ලා ඇති අතර, එම ඉල්ලීම් පහත පරිදි ලැබීම් හා නිර්දේශ ලබාදීම් සිදුකර ඇත.

| | | |
|---|---|---|
| 1. | ඉල්ලීම් ලිපි ලැබී ඇති ප්‍රමාණය | = 38 |
| 2. | එම ඉල්ලීම් සඳහා නිර්දේශ ලබාදී ඇති ප්‍රමාණය | = 29 |

## 02.8. භාරකාර පත්වීම් සිදුකිරීම හා සිද්ධස්ථාන සම්බන්ධ කටයුතු ග

විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තියේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ පාලනයේ පවත්නා බෞද්ධ සිද්ධස්ථාන වලට භාරකරුවන් පත් කිරීම හා ඔවුන්ගේ පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීම විහාර දේවාලගම් අංශය මඟින් සිදු කරනු ලබයි. ඒ අනුව විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තියෙන් පාලනය වන (ප්‍රධාන කාර්යාලය මගින්) විහාරස්ථාන /දේවාල 124 සඳහා 2018 වර්ෂයේ පහත පරිදි කටයුතු කර ඇත.

| | | |
|---|---|---|
| 1. | විහාරස්ථාන සංඛ්‍යාව | = 105 |
| 2. | භාරකාර ධූරයට පත් කරන ලෙස ලැබී ඇති ආකෘති පත්‍ර සංඛ්‍යාව | = 42 |
| 3. | භාරකාර ධූරයට පත් කර සහතික පත් නිකුත් කර ඇති සංඛ්‍යාව | = 39 |

| | | |
|---|---|---|
| 1. | දේවාල සංඛ්‍යාව | = 32 |
| 2. | බස්නායක නිලමේ ධූර කාලය අවසන් වූ දේවාල සංඛ්‍යාව | = 02 |
| 3. | බස්නායක නිලමේ ධූරයට පත් කර ඇති සංඛ්‍යාව | = 02 |

| | | |
|---|---|---|
| 1. | වත්කම් ලේඛන සකස් කර ඇති සිද්ධස්ථාන සංඛ්‍යාව | = 03 |
| a. | දේවාල සංඛ්‍යාව | = 01 |
| b. | විහාරස්ථාන සංඛ්‍යාව | = 03 |
| 2. | වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණ සිදු කර ඇති සිද්ධස්ථාන සංඛ්‍යාව | = 10 |
| 1. | වාර්ෂික අනුමාන අයවැය ලේඛන ලැබී ඇති සංඛ්‍යාව | = 82 |
| 2. | ආර්ධ වාර්ෂික අනුමාන අයවැය ලේඛන ලැබී ඇති සංඛ්‍යාව | = 52 |
| 3. | අනුමාන අය වැයවාර්තා අනුමත කොට නැවත යොමුකර ඇති සංඛ්‍යාව | = 73 |
| 4. | පඬුරු මුදල් සම්බන්ධ කටයුතු අධීක්ෂණය කර ඇති සංඛ්‍යාව | = 47 |

මීට අමතරව අපවත් වූ ස්වාමීන් වහන්සේලා සතුව තිබූ වාහන 10 ක අයිතිය ඉල්ලා සිටි වර්තමාන විහාරාධිපති ස්වාමීන් වහන්සේලා සඳහා එම නිර්දේශ ලබාදී ඇත. මැණික් බලපත්‍ර සඳහා ලැබුනු ඉල්ලීම් 03 ක් වෙනුවෙන් නිර්දේශ ලබාදීම මෙන්ම රජය විසින් සිද්ධස්ථාන සතු ඉඩම් අත්පත් කරගැනීමේදී වන්දි ලෙස ලැබුණු මුදල් නිදහස් කරගැනීමට නිර්දේශ ලබාදී ඇත. (එම නිර්දේශ මගින් නිදහස් කර ඇති වන්දි මුදල් වටිනාකම, රුපියල් 33,843,091.00 කි.)

තවද සිද්ධස්ථාන සම්බන්ධ නෛතික කටයුතු වෙනුවෙන් අධිකරණයේ/ අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභාවේ පෙනී සිටීම් 07 ක් ද, සිද්ධස්ථාන ගැටළු විසඳීමට අදාල ස්ථානීය පරීක්ෂණ 19 ක් ජංගම සේවා 06 කට සහභාගි වීම හා අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කිරීම් 29 ක් සිදු කර ඇත.

**<u>2019 වර්ෂයේදී ඉටු කිරිමට අපේක්ෂිත වැඩසටහන</u>**

i. විහාර දේවාලගම් ආඥාපනතට රෙගුලාසි සකස් කිරිම

ii. ඉඩම් ගැටළු පවත්නා සිද්ධස්ථානයන් හි ඉඩම් ගැටළු නිරාකරණය කිරිම


iii. අභ්‍යන්තර විගණන කාර්යයන් සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම මෙතෙක් විගනනය කර නොමැති සිද්ධස්ථාන සම්බන්ධයෙන් ගත යුතු පියවර සමාලෝචනය

iv. විහාර දේවාලගම් අංශයේ රාජකාරි ප්‍රමානය අඩු කිරිම

v. සිද්ධස්ථාන වෙනුවෙන් ඇති ලිපි ගොනු ඉතා විශාල විම, එම ගොනු විධිමත්ව ලේඛනාගාරයක සුරක්ෂිත ලෙස තැම්පත් කිරිම


vi. දෛනික සේවා සැපයීමේදී සැපයිය හැකි අත්‍යවශ්‍ය සේවාවන් මොනවද යන්න තහවුරු කර ගැනීම

# දහම් පාසල් අංශය


බෞද්ධ කටයුතු කොමසාරිස්
(දහම් පාසල් )
ශාඛා ප්‍රධාන
සංවර්ධන නිළධාරි 07
රාජ්‍ය කළමණාකරණ සහකාර 02
කාර්යාල කාර්ය සහයක 01
කාර්යාල කාර්ය සහයක 02

## 03.1. දහම් පාසල් ලියාපදිංචිය

දරුවන්ගේ සදාචාරාත්මක ගුණ දහම් වර්ධනය කිරීමට දහම් පාසල මහෝපකාරී වේ. ඒ අරමුණින් ආරම්භ කරන ලද සියලුම දහම් පාසල් බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරනු ලබයි. ලියාපදිංචියෙන් අනතුරුව දහම් පාසල පවත්වාගෙන යාමට අවශ්‍ය පෙළපොත්, නාමලේඛන ආදී අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ලබා දීම සඳහා වාර්ෂික තොරතුරු ලබා ගැනීම සිදු කරනු ලබයි.




**ප්‍රස්තාරය 03.1 - ශ්‍රී ලංකාවේ ලියාපදිංචි දහම් පාසල් සංඛ්‍යාවේ ප්‍රගතිය**


## 03.2. දහම් පාසල් ශ්‍රේණි විභාග පැවැත්වීම

දහම් පාසලෙහි ඉගෙනුම ලබන දරුවන්ගේ දහම් දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම විභාගය පැවැත්වේ. 2018 වර්ෂයේ දී විභාග මධ්‍යස්ථාන 3940 අයදුම්කරුවන් 980,262 දෙනෙක් සඳහා ශ්‍රේණි විභාගය පවත්වා ඇත.


| වර්ෂය | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අපේක්ෂක සංඛ්‍යාව | 716,840 | 757,927 | 765,887 | 777,576 | 787,692 | 808,161 | 813,432 | 855,868 | 950,274 | 913,720 | 976,639 | 988,262 |
| මධ්‍යස්ථාන සංඛ්‍යාව | 3,667 | 4,068 | 3,888 | 3,884 | 5,758 | 3,920 | 3,830 | 3,842 | 3,907 | 3,938 | 3,361 | 3940 |

## **03.3.** දහම් පාසල් ගුරු සිසු තොරතුරු රැස්කිරීම හා පවත්වාගෙන යාම.

දිවයින පුරා ඇති දහම් පාසල් වල ඉගෙනුම ලබන ශිෂ්‍යයින් සහ ගුරුවරුන් පිළිබඳ සංඛ්‍යා ලේඛන පවත්වා ගෙන යාම මෙම වැඩසටහන මඟින් සිදු කෙරේ. එමගින් දහම් පාසල් ගුරුවරුන් හා ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු ලබා ගෙන ඔවුන් සම්බන්ධව ඉදිරි කටයුතු සැළසුම් කිරීමට ඉඩ ප්‍රස්ථාව සැළසේ.





**ප්‍රස්තාරය 03.2 - ශ්‍රී ලංකාවේ දහම් පාසල් ශිෂ්‍ය සංඛ්‍යාවේ වර්ධනය**





**ප්‍රස්තාරය 03.3 - ශ්‍රී ලංකාවේ දහම් පාසල් ගුරු සංඛ්‍යාවේ වර්ධනය**

වාර්ෂිකව දහම් පාසල් ගුරුවරුන්ගේ පුස්තකාල දීමනා සහ නිල ඇඳුම් ලබා දීම සඳහා තොරතුරු ලබා ගැනීම සහ පෙළ පොත් ලබා දීම සඳහා ශිෂ්‍ය සංඛ්‍යාවන් ගණන් ගැනීම සඳහා වෙනත් වැඩසටහන් වලට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ අරමුණින් මෙම සංඛ්‍යා ලේඛන වාර්ෂිකව ලබා ගැනේ.




**2018 වර්ෂයේ දී දිස්ත්‍රික්ක 21 ක දහම් පාසල් 10,018 ක ශිෂ්‍ය සංඛ්‍යාව 2,169,368 කි.**

2018 වර්ෂයේ දහම් පාසල් ගුරු සිසු තොරතුරු රැස් කිරීමේ ආකෘති පත් 60, 000 ක් මුද්‍රණය කර ඇති අතර වියදම් වූ මුදල රුපියල් 357,063.50 කි.





**ප්‍රස්තාරය 03.4 - 2018 - දහම් පාසල් සංඛ්‍යාව**

## 03.4. 123 වන දහම් පාසල් දිනය සැමරීම.

දහම් පාසල් දිනය සැමරීමේ ජාතික වැඩසටහන පවත්වනු ලබන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රථම දහම් පාසල වන ගාල්ල, වැලිවත්ත, විජයානන්ද දහම් පාසල ආරම්භ කළ දිනය වන 1895 අගෝස්තු මස 03 වන දින බැවින් සෑම වර්ෂයකම අගෝස්තු 03 වැනි දිනයි. 2018 වර්ෂයට යෙදුණු 123 වැනි දහම් පාසල් දින සැමරුම් ජාතික වැඩසටහන අගෝස්තු 03 දින රත්නපුර පැල්මඩුල්ල රිල්හෙන අභයවර්ධනරාම විහාරස්ථානයෙදී පවත්වන ලදි.
රත්නපුර දිස්ත්‍රික්කයේ සිසු නිපුණතා හා ඇගයීම් වලින් ජයග්‍රහනය කරන ලද දහම් පාසල් දරුවන් වෙනුවෙන් ත්‍යාග පිරි නැමීම
දහම් පාසල් ගුරුවරුන්, දෙමව්පියන් හා දරුවන් සම්බන්ධ කරගෙන සාරධර්ම පෙරහැරක් පැවැත්වීම.
බෞද්ධ ප්‍රදර්ශන පැවැත්වීම ප්‍රදර්ශන පුවරු, ඡායාරූප, චිත්‍ර, මූර්ති, පොත් ඇතුළත්ව ප්‍රදර්ශනය පවත්වන ලදි.දහම් පාසල් කෙෂ්ත්‍රයට සිදුකල මෙහෙය වෙනුවෙන් ගෞරවණිය ස්වාමීන් වහන්සේලාට උපහාර පිදිම. දහම් පාසල් ගුරුවරුන් සඳහා වෛද්‍යාධාර ලබා දිම සාමවිනිසුරු පදවි ප්‍රදානය කිරිම.

## 03.5. ගුරු භවතුන් සඳහා ගුරු දීමනා, නිල ඇඳුම් ලබා දීම.




**ප්‍රස්තාරය 03.5 - 2018 - දහම් පාසල් ගුරුවරුන් සංඛ්‍යාව**

දහම්පාසල් ගුරු භවතුන් උදෙසා 2006 වසරේ සිට පුස්තකාල දීමනා ලෙස රුපියල් 2000 ක් ලබාදෙනු ලැබූ අතර 2017 වසරේ සිට ආරම්භ කල ගුරු දීමනා 2018 වර්ෂයේ රු.5000 වශයෙන් ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල 323 ක දහම් පාසල් 10,116 ක් සඳහා ගුරුභවතුන් 98,255ක් සුදුසුකම් ලබා ඇත.

ඒ අනුව එක් ගුරුභවතෙකු සඳහා රු 5000 ක වර්ෂික ගුරු දීමනාවක් ගෙවනු ලැබේ. ඒ සඳහා වෙන්ව තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය රු. 480,000,000.00 වන අතර ගුරුභවතුන් 95985 ක් සඳහා ප්‍රතිපාදන රු 480,000,000.00 ක් වෙන් කර ඇත.මෙ වර්ශයේ ගුරුවරුන්ගේ වර්ධනය වීමක් සිදුවී ඇති බැවින් 3007 දෙනෙකු සඳහා රු 15035000 ක ප්‍රතිපාදන ප්‍රමානයක් අවශ්‍ය තිබුණි ප්‍රදේශිය ලේකම් කාර්යාලවලින් ගෙවා ඉතිරිව එවූ ප්‍රතිපාදන වලින් එම ගුරුභවතුන් සඳහා ප්‍රතිපාදන වෙන්කළ අතර, නුවරඑළිය දිස්ත්‍රිකකයේ අඹගමුව ප්‍රදේශිය ලේකම් කාර්යාලයේ ගුරුභවතුන් 317 ක් සඳහා ප්‍රතිපාදන 1,585,000 ප්‍රමාණයක් අවශ්‍යව ඇත.

නිස්සරණාධ්‍යාශයෙන් දහම් පාසල් ගුරු සේවයේ නියුතු ගුරු භවතුන් දිරි ගන්වමින් ඔවුන්ගේ සේවය අගයනු වස් 2004 වසරේ සිට දහම් පාසල් ගුරු සේවයේ අඛණ්ඩ වසරක සේවා කාලයක් සම්පූර්ණ කළ වයස අවුරුදු 18ක් සම්පූර්ණ සෑම ගුරුවරයෙකුට ම නිල ඇඳුමක් ප්‍රදානය කරනු ලබයි.


නිල ඇඳුමක් ලැබීම පිළිබඳ සෑම ගුරුවරයෙකු ම පසු වන්නේ මහත් සොම්නසකිනි. නිල ඇඳුම් ප්‍රදානයත් සමඟ දහම් පාසල් ගුරුවරුන්ගේ ශීඝ්‍ර වර්ධනයක් ඇති වී තිබෙන බව ද දැකිය හැකිය. ඒ සමඟම දහම් පාසල් සිසු දරු දැරියන්ගේ ද වර්ධනයක් ඇති වී තිබේ. ඒ අනුව සදාචාරවත් සමාජයක් ගොඩනැඟීම සඳහා මෙලෙස දහම් පාසල් ගුරුවරුන් හට නිල ඇඳුම් ප්‍රදානය කිරීම මහෝපකාරී වේ. රජය මේ සඳහා සෑම වසරක දී ම රුපියල් මිලියන 150 කට අධික මුදලක් වැය කරනු ලබයි. ඒ අනුව මෙවර ද රුපියල් මිලියන 127.9 ක් පමණ ඒ වෙනුවෙන් වැය කර ඇත. ඒ අනුව 2018 වර්ෂයේ දහම් පාසල් ගුරුභවතුන් 86,000 ක් මේ සඳහා සුදුසුකම් ලැබූ අතර ඔවුන් සියළු දෙනා සඳහා නිල ඇඳුම් ලබා දී ඇත.

## 03.6. දහම් පාසල් ගුරු සහතිකපත්‍ර විභාගය

මෙම විභාගය පැවැත්වීමෙන් පහත අරමුණු සාක්ෂාත් කර ගැනීම අපේක්ෂා කෙරේ.

1. දැනට සේවයේ නියුතු දහම් පාසල් ගුරු භවතුන්ගේ අධ්‍යාපන සුදුසුකම් ඉහළ දැමීම.
2. දහම් පාසල්හි ඉගැන්වීම් කටයුතු වල නිරත වන ගුරු භවතුන්ගේ සේවය අගය කිරීම.
3. ගුරු භවතුන්ගේ දැනුම තව දුරටත් වර්ධනය කිරීම හා උසස් අධ්‍යාපනයට නැඹුරු කිරීම.
4. දහම් පාසල් ගුරු භවතුන් සඳහා සමාජ පිළිගැනීමක් ඇති කරලීම හා එමඟින් ඔවුන්ගේ සේවාව ජනතාවගේ ඇගයීමට ලක් කිරීම

2018 වර්ෂයේ දිස්ත්‍රික්ක 19 ක අපේක්ෂකයන් සඳහා විභාග මධ්‍යස්ථාන 23 ක දී මෙම විභාගය පවත්වන ලදි. ඒ සඳහා ඉදිරිපත් වූ අයදුම්කරුවන් සංඛ්‍යාව 11,494 කි. ඒ අතරින් 10,936 දෙනෙක් විභාගය සඳහා සුදුසුකම් සපුරන ලද අතර ඉදිරිපත් වූ අපේක්ෂකයින් සංඛ්‍යාව 7827 කි. ඉදිරිපත් නොවූ සංඛ්‍යාව 3109 වන අතර එය විභාගය සඳහා සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් සංඛ්‍යාවෙන් 28.43% ක ප්‍රතිශතයකි.




**ප්‍රස්තාරය 03.6 - දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාග ප්‍රතිපල - 2018**

2018 ජූනි මස දින පැවැත්වූ මෙම විභාගය සඳහා රු. 1,898374.70 පමන මුදලක් වැය වී ඇත. 2018 සැප්තැම්බර් මස 30 දිනය වන විට ප්‍රතිඵල නිකුත් කරන ලදි.

## 03.7. දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම

දහම් පාසල් සිසු දරු දැරියන්ගේ දැනුම වර්ධනය කිරීම උදෙසාත්, බුදු දහමේ ඉගැන්වීම් ප්‍රායෝගිකව යොදා ගැනීම උදෙසාත්, නැණ ගුණ සපිරි දරු පරපුරක් බිහි කිරීම උදෙසා වාර්ෂිකව පවත්වනු ලබන දහම් පාසල් සිසු නිපුණතා ඇගයීමේ වැඩසටහන මෙම වර්ෂයේ ද අති සාර්ථකව පවත්වනු ලැබීය.

මෙම සිසු නිපුණතා ඇගයීම පවත්වන්නේ දහම් පාසල්, ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා සමස්ත ලංකා වශයෙන් අදියර හතරකිනි.

මෙවර වැඩසටහන පැවැත්වූයේ මොණරාගල මාහානාම ජාතික පාසලේ වන අතර ප්‍රධාන ආරාධිතයා වශයෙන් ගරු බුද්ධශාසන අමාත්‍ය ගාමිණී ජයවික්‍රම මැතිතුමාගේ සම්ප්‍රාප්තිය සිදු විය.

ප්‍රාදේශීය මට්ටමේ සංවිධාන කටයුතු සඳහා ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා වෙත රු. 10,000.00 බැගින් ද, දිස්ත්‍රික් සංවිධාන කටයුතු වෙනුවෙන් දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩල ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා වෙත රු. 18,000.00 බැගින් ද ලබා දෙන ලදි.

මෙම වැඩසටහනේ ඇස්තමේන්තුගත මුදල රු. 24,966,828.43 වන අතර 2018 වර්ෂය වෙනුවෙන් වැය විය.





03.8. දහම් පාසල් පෙළ පොත් මුද්‍රණය

සදාචාරවත් සමාජයක් බිහි කිරීම උදෙසා අත්‍යවශ්‍ය වන දහම් පාසල් අධ්‍යාපනය වැඩි දියුණු කිරීම අරමුණු කර ගෙන දහම් පාසල් පෙළ පොත් මුද්‍රණය හා දහම් පාසල් වෙත බෙදා හැරීම මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි.

වර්ෂයට අවශ්‍ය පෙළ පොත් ප්‍රමාණය දහම් පාසල් මඟින් දැනුම් දීමෙන් අනතුරුව පොත් මුද්‍රණය සිදු කරනු ඇත. මෙම පොත් මුද්‍රණය කිරීම රජයේ මුද්‍රණාලයෙන්, රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවෙන් සිදු කරන ලදි. ඒ සඳහා වෙන් කරන ලද මුදල රු. 150,000,000 ක් ද, වැය වූ සම්පූර්ණ වියදම රු. 149,994,482 කි.

එම පොත් මුද්‍රණය කරවා 2017 වර්ෂයට සියළුම දහම් පාසල් වලට බෙදා දිය හැකි පරිදි දෙපාර්තමේන්තුවේ ගබඩාවට භාර දීමෙන් පසු දිවයින පුරා පිහිටි ලියාපදිංචි දහම් පාසල් වලට බෙදා හැරීම සිදු කරන ලදි.

| | |
|---|---|
| මුළු දිස්ත්‍රික්ක ගණන | = 21 |
| ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල ගණන | = 322 |
| දහම් පාසල් ගණන | = 10048 |
| බෙදා හරින ලද මුළු පොත් ගණන | = 3164940 |
| සාධුචර්ය | =2414056 |

වගුව 03.5 - දහම් පාසල් පෙළ පොත් බෙදීම 2017 - සාරාංශය

- 2020 සඳහා මුද්‍රණයට ලබාදී ඇති පොත් ප්‍රමාණය 237,00002,00


## 03.9. බුද්ධ ජයන්ති පොත් හල

### 2018 ප්‍රගතිය

මහජනතාවගේ අවශ්‍යතාව සඳහා දහම් පොත් අලෙවි කිරීම බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ඇති බුද්ධ ජයන්ති පොත් හල මඟින් සිදු කරනු ලබයි. සංක්ෂිප්තව සරල සිංහලයට නගන ලද ත්‍රිපිටක ග්‍රන්ථ, බෞද්ධ විශ්වකෝෂ පොත් සිංහල හා ඉංග්‍රීසි බසින් රචිත බෞද්ධ විචාර පොත් රාශියක් මෙහි අලවිය සඳහා තිබේ.

2018 වසරේ පොත් අලෙවියෙන් රුපියල් 465,163.00 ක මුදලක් ලැබී ඇත. එම මුදල් ඒ ඒ දිනවල ප්‍රධාන කායීාලය වෙත භාර දෙන ලදී.

# සංවර්ධන අංශය


සහකාර කොමසාරිස්
අංශ ප්‍රධාන
සංවර්ධන නිළධාරි 06
රාජ්‍ය කළමණාකාර සහකාර 04
කාර්යාල කාර්ය සහයක 01

## සංවර්ධන අංශයේ කාර්ය භාරය

- රාජ්‍ය වෙසක් උත්සවය සංවිධානය කිරිම
- නිදහස් දින පිරිත හා නිදහස් දින ආගමික වතාවත් පැවැත්වීම සංවිධානය කිරීම
- ශ්‍රී සංඝමිත්තා මහරහත් තෙරණින්වහන්සේගේ ගුණ සමරු උළෙල සංවිධානය කිරීම
- අධ්‍යාත්මික සංවර්ධන වැඩ සටහන
- ශාසනාරක්ෂක මණ්ඩල ක්‍රියාත්මක කිරීම
- සිල්මාතා සංගමයේ කටයුතු සංවිධානය කිරීම
- සිල්මෑණියන්වහන්සේලාගේ අධ්‍යාපන ආයතන පවත්වා ගෙන යාම
- දහම් පාසල් සංවර්ධනය සඳහා ආධාර ලබාදීම
- ශාසනාරක්ෂක මණ්ඩල සඳහා උපකරණ ලබා දීම
- සිල්මෑණියන්වහන්සේලා ලියාපදිංචි කිරීම
- සිල්මෑණියන්වහන්සේලා සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම
- සිල්මාතා ආරාම ලියාපදිංචි කිරීම
- විහාරස්ථ/ආරාම දායක සභා ලියාපදිංචි කිරීම
- විහාරස්ථ කාර්ය සාධක සමිති ලියාපදිංචි කිරීම
- විහාරස්ථ ශාසනාරක්ෂක මණ්ඩල ලියාපදිංචි කිරීම
- අටපිරිකර අලෙවි ආයතන හා නිෂ්පාදන ආයතන ලියාපදිංචි කිරීම
- සිව්පස ආධාර ලබාදීම
- ආදාහන උත්සව සඳහා ආධාර ලබාදීම
- පෙරහැරවල් සඳහා අනුග්‍රහය දැක්වීම
- පූජනීය ස්ථාන සඳහා සහනදායි පදනම යටතේ විදුලි,ජල හා දුරකතන ගාස්තු අඩුකිරීමට නිර්දේශ ලබාදීම
- ලේඛකාධාර යටතේ පොත් මිළදී ගැනීම
- උපසම්පදා උත්සව සඳහා වැඩම කරන ස්වාමින්වහන්සේලා සඳහා ගමන් වියදම් ගෙවීමේ කටයුතු
- ප්‍රධාන නිකායත්‍රයේ මහානායක උත්සව සංවිධානය කිරීම
- බුදුන්වහන්සේ ලංකාවට වැඩම කර වසර 2600 පිරීම නිමිත්තෙන් පැවැත්වෙන උත්සවය
- චීන ධාතුන්වහන්සේ ප්‍රදර්ශණය කිරීම
- ක්‍රියාකාරී සැලැස්ම, මාසික/කාර්තු ප්‍රගති වාර්තා සැකසීම

## 04.1. සිල් මෑණියන්වහන්සේලා සම්බන්ධ කටයුතු

### 04.1.1 සිල්මාතා අධ්‍යාපන ආයතන වැඩි දියුණු කිරීම.

දිවයින පුරා විසිරී සිටින සිල් මෑණියන්වහන්සේලා සඳහා තම අධ්‍යාපනික මට්ටම ඉහළ නංවා ගනිමින් දැනුම වර්ධනය කර ගැනිමට අවස්ථාව සලසා දීම සඳහා සිල්මාතා අධ්‍යාපන ආයතන පිහිටුවා ඇති අතර මුලටියන පියදාස රත්නායක අනුස්මරණ සිල්මාතා පුහුණු ආයතනයේදී 2018.02.08 වන දින සිට 2018.02.25 දින දක්වා විශේෂ භාවනා වැඩසටහනක්ද 2018.02.24 වන දින ආයතනයේ වාර්ෂික සර්ව රාත්‍රික පිරිත් දේශණයද පවත්වන ලදී. 2018 වසරේ කෙටිකාලීන පාඨමාලාව 2018.05.26 වන දින සිල්මෑණියන් වහන්සේලා 16 දෙනෙකු සඳහා ආරම්භ කෙරුණු අතර කෙටිකාලීන පාඨමාලාව සඳහා හා සිල්මාතා පුහුණු ආයතනයේ නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය රු.මිලියනයක ප්‍රතිපාදන හා සිල්මාතා පුහුණු ආයතනයේ තාප්පය ඉදි කිරීම සඳහා රු. මිලියන දෙකක ප්‍රතිපාදන ලබා දී ඇති අතර තාප්පය ඉදි කිරීමේ කටයුතු අවසන් කර ඇත.

2018 වසරේ කෙටිකාලීන පාඨමාලාව






2018 වසරේ වාර්ෂික සර්ව රාත්‍රික පිරිත් දේශණය





ඉදිකිරීම් අවසන් කරන ලද සිල්මාතා අධ්‍යාපන ආයතන තාප්පය





මේ වන විට කැළණිය ඊරියවැටිය සිල්මාතා අධ්‍යාපන ආයතනයේ ඉදිකිරීම් කටයුත සම්පූර්ණයෙන්ම අවසන් අතර විදුලි සෝපානය සවි කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. 2019 වසරේදී සිල්මාතා මූලස්ථානය විවෘත කිරීමට කටයුතු සැලසුම් කරමින් පවතී.සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා පවත්වා ගෙන යාමට නියමිත පුස්තකාලය සඳහා අවශ්‍ය පොත් මිළදී ගැනීමේ කටයුතු සිදු කර අවසන් වන අතර කැළණිය හා අනුරාධපුර අධ්‍යාපන ආයතන සඳහා බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගෙන පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු සැලසුම් කරමින් පවතී.එසේම 2018.01.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන්

දස සිල්මෑණියන්වහන්සේලාගේ අධ්‍යාපන ආයතන වැඩිදියුණු කිරීම සඳහා රු.මිලියන පහලොවක ප්‍රතිපාදන ලබා දීම අනුමත කර ඇත.

<u>කැළණිය සිල්මාතා අධ්‍යාපන ආයතනය</u>






<u>නව සංඝමිත්තාරාමය</u>






## 04.1.2 සිල් මෑණියන්වහන්සේලා ලියාපදිංචි කිරීම හා හැඳුනුම්පත් නිකුත් කිරීම.

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මඟින් සිල් මෑණියන්වහන්සේලා සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම හා සිල් මෑණියන් වහන්සේලා ලියාපදිංචිය සිදු කරන අතර දැනට මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සිටින සිල් මෑණියන්වහන්සේලා සංඛ්‍යාව 2027 ක් වන අතර එය පහත පරිදි වේ.




## 04.1.3 සිල්මාතා ආරාම ලියාපදිංචි කිරීමේ කටයුතු

දැනට ලංකාවේ ලියාපදිංචි සිල් මාතා ආරාම සංඛ්‍යාව පහත පරිදි වේ.




## 04.1.4. ජාතික සිල්මාතා සංගමය

මේ යටතේ ජාතික සිල්මාතා සංගමයේ රැස්වීම් හා දිස්ත්‍රික් සිල්මාතා රැස්වීම් පැවැත්වීම සිදුකරන අතර එම රැස්වීම් සංවිධානය, එම රැස්වීම් වලට සහභාගි වන සිල් මෑණියන්වහන්සේලා සඳහා ගමන් වියදම්, දානය සැපයුම් වෙනුවෙන් ගෙවීම වෙනුවෙන් වියදම් දරනු ලබයි. 2018 වසරේ ජාතික සිල්මාතා සංගමයේ සමස්ත ලංකා රැස්වීම් 03 ක් හා කෘත්‍යාධිකාරි මණ්ඩල රැස්වීම් 03 ක් පවත්වා ඇත. දිස්ත්‍රික් සිල්මාතා සංගම් රැස්වීම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන හා ගමන් වියදම් ලබා දී ඇත.





## 04.2 කලා ශිල්ප සහ බෞද්ධ විද්වතුන්ට උපහාර පිදීම.

දේශීය කළා ශිල්ප නැංවීම මෙම දෙපාර්තමේන්තුවේ අරමුණක් බැවින් එකී කාර්යය වෙනුවෙන් සිදුකරන කාර්යයන් සඳහා මූල්‍යමය ආධාර පිරිනැමීම සිදුකරනු ලබයි. විශේෂයෙන් ශ්‍රී ලාංකීය අභිමානය සුරැකීමත් එකී කලා ශිල්පීන්ගේ දක්ෂතාවන් නැංවීමට කිසියම් උනන්දුවක් ඇති කරලීම අනාගත ලෝකයට දේශීය කලාවන් දායාද කිරිම සේ සලකා මෙම කාර්යය නිරන්තරයෙන්ම සිදු කරනු ලබයි.ඒ අනුව බෞද්ධ විද්වතුන්ට උපහාර පිදීමේ වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 කට හා ප්‍රාදේශීයව සංවිධානය වන පෙරහැර, සංස්කෘතික අංග සඳහා අනුග්‍රහය දැක්විම යටතේ කලා ශිල්ප සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 32 කට ප්‍රතිපාදන ලබා දී ඇත.

## 4.3.දහම් පාසල් සඳහා පහසුකම් සැපයිම.

### 04.3.1 දහම් පාසල් ගොඩනැගිලි හා උපකරණ ආධාර

නව ගොඩනැගිලි ඉදි කිරීම, සංවර්ධනය කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු. 200,000.00 ක ප්‍රතිපාදන හා දහම් පාසල් උපකරණ (ඩෙස්ක්, බංකු හා අත්‍යවශ්‍ය උපකරණ) ලබා දීම වෙනුවෙන් රු. 100,000.00 ක ප්‍රතිපාදන වන සේ ඌණ සංවර්ධිත දහම් පාසල් ප්‍රතිසංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ බුද්ධශාසන අමාත්‍යාංශයේ තේරීම් කමිටුව මඟින් තෝරා ගන්නා ලද දහම් පාසල් 134 ක් ප්‍රතිසංවර්ධනය කිරීම සඳහා රුපියල් 23,200,000.00 ක ප්‍රතිපාදන කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් වෙත වෙන් කර ඇත. එසේම දහම් පාසල් ප්‍රතිසංවර්ධනය කිරීමේ වැඩපිළිවෙල යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එක් දහම් පාසලක් වෙත රු. 94,000 ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

**04.4** විහාරස්ථ කාර්ය සාධක සමිති, දායක සභා හා විහාරස්ථ ශාසනාරක්ෂක මණ්ඩල ලියාපදිංචි කිරීමේ කටයුතු

| අනු අංකය | දිස්ත්‍රික්කය | විහාරස්ථ දායක සභා ගණන | සිල් මාතා ආරාම දායක සභා ගණන | විහාරස්ථ කාර්ය සාධක සමිති ගණන | විහාරස්ථ ශාසනාරක්ෂක මණ්ඩල ගණන |
|---|---|---|---|---|---|
| 1 | කොළඹ | 148 | 10 | 358 | 24 |
| 2 | කළුතර | 194 | 08 | 284 | 60 |
| 3 | ගම්පහ | 244 | 18 | 233 | 47 |
| 4 | ගාල්ල | 287 | 06 | 293 | 65 |
| 5 | මාතර | 252 | 07 | 297 | 53 |
| 6 | හම්බන්තොට | 216 | 10 | 190 | 44 |
| 7 | කුරුණෑගල | 682 | 31 | 227 | 18 |
| 8 | පුත්තලම | 131 | 02 | 72 | 18 |
| 9 | මහනුවර | 325 | 14 | 410 | 66 |
| 10 | මාතලේ | 100 | 03 | 152 | 9 |
| 11 | මඩකලපුව | 05 | 0 | 1 | 0 |
| 12 | මන්නාරම | 03 | 0 | 0 | 3 |
| 13 | කිලිනොච්චිය | 0 | 0 | 0 | 0 |
| 14 | නුවරඑළිය | 142 | 4 | 87 | 27 |
| 15 | මොණරාගල | 110 | 03 | 108 | 45 |
| 16 | බදුල්ල | 155 | 05 | 169 | 16 |
| 17 | කෑගල්ල | 255 | 19 | 291 | 116 |
| 18 | රත්නපුර | 255 | 08 | 219 | 75 |
| 19 | ත්‍රිකුණාමලය | 30 | 0 | 34 | 1 |
| 20 | අනුරාධපුර | 218 | 13 | 257 | 15 |
| 21 | පොළොන්නරුව | 110 | 09 | 100 | 1 |
| 22 | අම්පාර | 26 | 0 | 84 | 11 |
| 23 | වව්නියාව | 21 | 0 | 5 | 0 |
| 24 | මුලතිව් | 01 | 0 | 1 | 0 |
| 25 | යාපනය | 05 | 0 | 0 | 0 |
| | එකතුව | 3915 | 170 | 3872 | 714 |

## 04.5 ශාසනාරක්ෂක මණ්ඩල කටයුතු ප්‍රවර්ධනය කිරිම.

### 04.5.1 ශාසනාරක්ෂක මණ්ඩල සඳහා පහසුකම් සැපයිම.

දිවයිනේ ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල 322 ක් ක්‍රියාත්මක වේ. දිස්ත්‍රික්ක 22 ක ක්‍රියාත්මක වන මෙම ශාසනාරක්ෂක මණ්ඩල මඟින් ප්‍රාදේශීය වශයෙන් සිදුකරන කාර්යභාරය වෙනුවෙන් අවශ්‍ය උපකරණ මෙමඟින් ලබා දීම සිදුකරයි. ශාසනාරක්ෂක මණ්ඩල යටතේ විහාරස්ථ ශාසනාරක්ෂක මණ්ඩල හා දහම් පාසල් පද්ධතිය ක්‍රියාත්මක වේ. ගම් මට්ටමින් පවතින සංවර්ධන කාර්යයන් ද මෙම මණ්ඩලය ඔස්සේ සිදුවේ.

| අනු අංකය | දිස්ත්‍රික්කය | දි/ලේ/කා සහප්‍රදේශීය ලේකම් කාර්යාලය | ලබාදෙන උපකරණ | වෙන්කර ඇති ප්‍රතිපාදන | දිස්ත්‍රික්ක අනුව වෙන් කරන ලද ප්‍රතිපාදන |
|---|---|---|---|---|---|
| 1 | කුරුණෑගල | දි/ලේ/කාර්යාලය | පරිගණකය/ප්‍රින්ටරය | 105,000.00 | |
| 2 | | පන්නල | පරිගණකය/ප්‍රින්ටරය | 105,000.00 | |
| 3 | | පොල්ගහවෙල | පරිගණකය/ප්‍රින්ටරය | 105,000.00 | |
| 4 | | මාස්පොත | පරිගණකය/ප්‍රින්ටරය | 105,000.00 | |
| 5 | | බමුණාකොටුව | පරිගණකය/ප්‍රින්ටරය | 105,000.00 | 1,183,000.00 |
| 6 | | නාරම්මල | පරිගණකය/ප්‍රින්ටරය | 105,000.00 | |
| 7 | | ඇහැටුවැව | පරිගණකය/ප්‍රින්ටරය | 105,000.00 | |
| 8 | | ගල්ගමුව | පරිගණකය/ප්‍රින්ටර්ය/වාංනේ කබඩ් 01 | 122,000.00 | |
| 9 | | පොල්පිතිගම | කාර්යාල මේස 02/පුටු 02/වාංනේ කබඩ් 01/පරිගණක මේස 01/පරිගණක පුටු 01 | 91,000.00 | |
| 10 | | කොටවෙහෙර | කාර්යාල මේස 02/පුටු 02/වාංනේ කබඩ් 01/පරිගණක මේස 01 | 84,000.00 | |
| 11 | | බිංගිරිය | කාර්යාල මේස 02/පුටු 02/වාංනේ කබඩ් 01/පරිගණක මේස 01/ප්‍රින්ටර් 01 | 98,000.00 | |
| 12 | | කුරුණෑගල | කාර්යාල මේස 01/පුටු 01/වාංනේ කබඩ් 01/පරිගණක මේස 01/ප්‍රින්ටර් 01 | 53,000.00 | |
| 13 | රත්නපුර | කලවාන | කාර්යාල මේස 01/පුටු 01/වාංනේ කබඩ් 01/පරිගණක මේස 01/ප්‍රින්ටර් 01 | 60,000.00 | |
| 14 | | ඇඹිලිපිටිය | ප්‍රින්ටර් 01 | 15,000.00 | |
| 15 | | කහවත්ත | කාර්යාල පුටු 01 | 8,000.00 | 129,000.00 |
| 16 | | කුරුවිට | කාර්යාල මේස 02/පුටු 02 | 46,000.00 | |
| 17 | අනුරාධපුරය | මිහින්තලය | පරිගණකය/ප්‍රින්ටරය | 105,000.00 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 18 | බදුල්ල | බදුල්ල | පරිගණකය/ප්‍රින්ටරය | 105,000.00 | 105,000.00 |
| 19 | | පස්සර | පරිගණකය/ප්‍රින්ටරය | 105,000.00 | |
| 20 | | හල්දුම්මුල්ල | පරිගණකය/ප්‍රින්ටරය/පරිගණක මේස 01 | 115,000.00 | |
| 21 | | හපුතලේ | පරිගණකය/ප්‍රින්ටරය | 105,000.00 | 540,000.00 |
| 22 | | මීගහකිවුල | පරිගණකය/කාර්යාල මේස 01 | 110,000.00 | |
| 23 | කොළඹ | කොලොන්නාව | පරිගණකය/ප්‍රින්ටරය | 105,000.00 | |
| 24 | | කැස්බෑව | පරිගණකය/ප්‍රින්ටරය | 105,000.00 | 210,000.00 |
| 25 | පොලොන්නරුව | තමන්කඩුව | පරිගණකය | 90,000.00 | |
| 26 | | මැදිරිගිරිය | ප්‍රින්ටර් 01 | 15,000.00 | 105,000.00 |
| 27 | ගාල්ල | දි/ලේ/කාර්යාලය | පරිගණකය/ප්‍රින්ටරය | 105,000.00 | |
| 28 | | ඇල්පිටිය | පරිගණකය/ප්‍රින්ටරය | 105,000.00 | |
| 29 | | නියාගම | පරිගණකය/ප්‍රින්ටරය | 105,000.00 | 315,000.00 |
| 30 | කළුතර | බුලත්සිංහල | පරිගණකය | 90,000.00 | 90,000.00 |
| 31 | මහනුවර | තුම්පනේ ගලගෙදර) | ප්‍රින්ටර් 01 | 15,000.00 | 15,000.00 |
| 32 | පුත්තලම | දංකොටුව | පරිගණකය/කාර්යාල මේස 01/පුටු 01 | 113,000.00 | 113,000.00 |
| 33 | හම්බන්තොට | ඕකේවෙල | පරිගණකය/ප්‍රින්ටරය | 105,000.00 | 105,000.00 |
| 34 | මාතර | දික්වැල්ල | පරිගණකය | 90,000.00 | 90,000.00 |
| | | | මුළු ප්‍රතිපාදන ප්‍රමාණය | 3,000,000.00 | 3,000,000.00 |

## 04.5.2 ශාසනාරක්ෂක මණ්ඩල වියදම් දැරීම.

මේ යටතේ ශාසනාරක්ෂක මණ්ඩල රැස්වීම් පැවැත්වීම ,එම රැස්වීම් සංවිධානය කිරීම හා එම රැස්වීම් වලට සහභාගි වන ස්වාමින්වහන්සේලාගේ ගමන් වියදම් ගෙවීම , දානය සැපයුම් වෙනුවෙන් වියදම් දැරීම සිදු කරනු ලබයි. 2018.08.21 වන විට සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල රැස්වීම් 02 ක් හා කාත්‍යාධිකාරි මණ්ඩල රැස්වීම් 07 ක් හා අනු කමිටු රැස්වීමක් පවත්වා ඇත. සියලුම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල වල ගමන් වියදම් ගෙවීමේ කටයුතු සිදු කරමින් පවතී. තවද බස්නාහිර, වයඹ හා සබරගමුව පළාත් ආවරණය වන පරිදි ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල වල ගරු සභාපති හා ගරු ලේඛකාධිකාරි ස්වාමින්වහන්සේලා දැනුවත් කිරීමේ දෙදින වැඩසටහන් තුනක් පවත්වා ඇත.

## 04.6 ජාතික උත්සව සංවිධානය කිරීම.

## 04.6.1 නිදහස් පිරිත

2018 පෙබරවාරි මස 02 වන දින කොළඹ 07 නිදහස් මන්දිරයේදී සර්ව රාත්‍රික පිරිත් දේශනාව ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහානායක සිරි සීලවංස වංසාලංකාර ත්‍රිපිටක වාගීෂ්වරාචාර්ය අග්ගමහා පණ්ඩිත විනයාචාර්ය විනය විශාරද ත්‍රිපිටක ධර්ම චක්‍රවර්ති අතිපූජ්‍ය නාපාන පේමසිරි මහානායක ස්වාමින්වහන්සේගේ අනුශාසනා පරිදි කොළඹ 10 මරදාන ශ්‍රී ලංකා විද්‍යාල පිරිවෙණ් විහාරාධිපති පූජ්‍ය මැදගම නන්දවංශ ස්වාමින්වහන්සේගේ ප්‍රධානත්වයෙන් ගෞරවනීය මහා සංඝ රත්නය විසින් පවත්වන ලදී.මෙම අවස්ථාවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ රාජ්‍ය පරිපාලන අමාත්‍ය ගරු වජිර අබේවර්ධන මැතිතුමා , ගරු බුද්ධශාසන අමාත්‍ය ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා ඇතුළු මැතිඇමතිවරුන්, රාජ්‍ය නිලධාරින් හා බොදු උවැසි උවැසියන් බොහෝ පිරිසක් සහභාගි වූහ.

## 4.6.2 ජාතික නිදහස් දින ආගමික වතාවත්

2018 පෙබරවාරි මස 04 වන දිනට යෙදී තිබූ 70 වන ජාතික නිදහස් දිනය නිමිත්තෙන් බෞද්ධාගමික වැඩසටහන පෙ.ව. 6.00 ට කොළඹ 03 ධර්මකීර්ත්‍යාරාමයේදී (පොල්වත්ත පන්සල) වැතර මහින්ද නායක ස්වාමින්වහන්සේගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ගරු කථානායක කරු ජයසූරිය මැතිතුමා , ගරු බුද්ධශාසන අමාත්‍ය ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා ඇතුළු මැතිඇමතිවරුන්, රාජ්‍ය නිලධාරින් හා බොදු උවැස උවැසියන් මෙන්ම පාසල් දූවා දරුවන් පිරිසක්ද සහභාගි වූහ.





**4.6.3. රාජ්‍ය වෙසක් උත්සවය**

ශ්‍රී බු.ව. 2561 වන රාජ්‍ය වෙසක් උත්සවය"චිත්තං දන්තං සුඛා වහං" (දැමුණු සිත සුව ගෙන දේ ) යන තේමාව මූලික කර ගනිමින් 2018 අප්‍රේල් මස 28 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමගේ ප්‍රධානත්වයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ බිංගිරිය දේවගිරි රජමහා විහාරස්ථානයේදී පවත්වන ලදී.









**පෝය දින ආගමික වැඩසටහන**





**වෙසක් සතිය වැඩ සටහන (2018. 04. 26 සිට 2018. 05. 02)**

දිවයිනේ සියළුම ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල වෙසක් සතිය තුළ පහත සඳහන් මාතෘකා යටතේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී. එසේම කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි 2018 ජනවාරි මස සිට මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර 2018.04.29 වන දින පොහෝ දින ආගමික වැඩසටහන හා 2018.04.26 වන දින සිට 2018.05.02 දක්වා වූ වෙසක් සතියේ වැඩසටහන් සාර්ථකව පවත්වන ලදී.

පළමු වන දිනය - පරිසරය හා බුදු දහම
දෙවන දිනය - පොහෝදින ආගමික වැඩ සටහන
තෙවන දිනය - සෞඛ්‍ය හා බුදු දහම
සිව්වන දිනය - සාහිත්‍ය හා බුදු දහම
පස්වන දිනය - කලාව හා බුදු දහම
හයවන දිනය - වෘත්තිකයන් හා බුදු දහම
හත්වන දිනය - සමාජ සංවර්ධනය, ආර්ථිකය හා බුදු දහම







එසේම රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමීව කුරුණෑගල දිස්ත්‍රික්කයේ පහත සඳහන් පූර්වගාමී වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පවත්වන ලදී.

| වැඩසටහනේ නම | පවත්වා ඇති වැඩසටහන් ගණන |
|---|---|
| ප්‍රත්‍යවේක්ෂා ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන | 84 |
| ජංගම සේවා වැඩසටහන | 02 |
| දහම් පාසල් ගුරු පුහුණු වැඩසටහන | 16 |
| සාමණේර ස්වාමීන් වහන්සේලා පුහුණු කිරීමේ වැඩසටහන | 01 |
| සිල් මැණියන්වහන්සේලා පුහුණු කිරීමේ වැඩසටහන | 03 |
| මා පිය දූ දරු සෙනෙහස මුල් කරගත් සෙනෙහස වැඩසටහන | 29 |
| සෞඛ්‍ය හා බුදු දහම වැඩසටහන | 29 |
| ළමා භාවනා වැඩසටහන | 29 |
| වෘත්තිකයින් හා බුදු දහම | 10 |
| කෙටි බෞද්ධ නාට්‍ය තරඟාවලිය | ප්‍රාදේශීය තරඟ හා දිස්ත්‍රික් තරඟ පවත්වා අවසන් කර ඇත. |
| භක්ති ගීත වැඩසටහන් | ප්‍රාදේශීය තරඟ හා දිස්ත්‍රික් තරඟ පවත්වා අවසන් කර ඇත. |
| බුදු දහමින් පෝෂිත සිංහල සාහිත්‍ය හා හෙළ කලාව | 30 |
| සාරධර්ම පෙරහැර වැඩසටහන | 09 |
| තිරසර පරිසරයක් සඳහා බුදුදහම | 04 |
| විශේෂ ධර්ම දේශණා හා පිණ්ඩපාත පිංකම් | 05 |
| සමාජ සංවර්ධනය හා බුදු දහම වැඩසටහන | 01 |

### 4.6.4. මහානායක ස්වාමීන්වහන්සේලාගේ සන්නස් පත්‍ර පිළිගැන්වීමේ උත්සව කටයුතු

ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ සභාපති අතිපූජ්‍ය ගන්තුනේ අස්සජි මහානායක ස්වාමීන්වහන්සේ වෙත ශ්‍රී සන්නස් පත්‍රය පිළිගැන්වීමේ උත්සවය 2018 මාර්තු මස 27 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.





### 4.6.5. ශ්‍රී සංඝමිත්තා මහරහත් තෙරණින්වහන්සේගේ ගුණ සමරු උළෙල

ශ්‍රී සංඝමිත්තා මහරහත් තෙරණින්වහන්සේගේ 2326 වන ගුණ සමරු උළෙල සහ සංඝමිත්තා පෙරහැර 2018.12.22 හා 23 දිනයන්හිදි අනුරාධපුරයේදී සාර්ථකව පවත්වන ලදී. ඊට සමගාමීව අරිප්පු පාර නව සංඝමිත්තාරාමයේදී දම්සක් පැවතුම් සූත්‍ර දේශණාවක් සමස්ත ලංකා සිල්මාතා සංගමයේ සිල්මැණියන්වහන්සේලාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.










### 4.6. උපසම්පදා උත්සව සංවිධානය

2018 වර්ෂයේදී ඒ ඒ නිකාය පාර්ශ්ව වල ගරු ලේඛකාධිකාරි ස්වමාන්වහන්සේලා විස්තර ලබා දුන් උපසම්පදා අපේක්ෂක සාමණේර ස්වාමින්වහන්සේලා වෙත උපසම්පදා පුණ්‍යකර්ම සිදුකරන ස්ථානවලදී ප්‍රාදේශීය ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ ගමන් වියදම් දීමනාව ප්‍රදානය කරනු ලැබීය.

| නිකාය පාර්ශ්වය | ස්වාමින් වහන්සේලා සංඛ්‍යාව | ප්‍රදානය කරන ලද ගමන් වියදම් මුදල |
|---|---|---|
| ස්‍යාමෝපාලි වංශික මහා නිකායේ ශ්‍රී රෝහණ පාර්ශවය | 34 | 102,000.00 |
| ස්‍යාමෝපාලි වංශික මහා නිකායේ අස්ගිරි මල්වතු මහා විහාර පාර්ශවය | 360 | 1,080,000.00 |
| ස්‍යාමෝපාලී වංශික වනවාස නිකාය | 63 | 189,000.00 |
| ශ්‍රී කල්‍යාණිවංශ නිකාය | 20 | 60,000.00 |
| උඩරට අමරපුර නිකාය | 30 | 90,000.00 |
| ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකාය | 479 | 1,437,000.00 |
| අමරපුර සිරි සද්ධම්මවංස මහා නිකාය | 68 | 204,000.00 |
| සපරගමු අමරපුර සාමග්‍රී මහා සංඝ සභාව | 11 | 33,000.00 |
| **එකතුව** | **1065** | **3,195,000.00** |

### 4.8 ආදාහන පූජෝත්සව ආධාර

මේ යටතේ විවිධ ප්‍රදේශ වල ස්වාමින්වහන්සේලා හා සිල් මැණියන්වහන්සේලාගේ ආදාහන පූජෝත්සව 172 ක් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කර ඇත.

### 4.9 සිව්පස ආධාර ලබා දිම.

මෙම වැඩසටහන මගින් තෝරාගත් දිස්ත්‍රික්කයන්හි තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් දුෂ්කර ප්‍රදේශයන්හි පිහිටි විහාරස්ථාන වල සිව්පසය සපයා ගැනීමට අපහසු ස්වාමින් වහන්සේලා සඳහා ආධාර ලබා දීම සිදු කරනු ලබයි. ඒ අනුව 2017 වසරේදී ලබා දීමට ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා එම වසරේ අයදුම්පත් එවන ලද සිව්පස ආධාර ලබා දීමට නොහැකි වූ විහාරස්ථානවල වැඩ වෙසෙන ස්වාමින් වහන්සේලා සඳහා සිව්පස ආධාර 2018 වසරේදී ලබා දී ඇත.

### 4.10 විහාරස්ථාන සඳහා දුරකථන, විදුලිය හා ජලය සහනදායී පදනම මත ලබා දීම.


මෙමඟින් පූජනීය ස්ථාන සඳහා දුරකථන, විදුලිය හා ජලය සඳහා සහනදායි පදනම මත ගාස්තු අය කිරිමට අවශ්‍ය නිර්දේශ ලබා දීම සිදු කරේ. ඒ අනුව විහාරස්ථාන 10 ක් සඳහා නිර්දේශ ලබා දී ඇත.

### 4.11 2019 වර්ෂයේදී ඉටු කිරිමට අපේක්ෂිත වැඩසටහන

i. මුලටියන පියදාස රත්නායක සිල්මාතා අභ්‍යාස ආයතනයේ කෙටිකාලීන හා දිගුකාලීන පාඨමාලා පැවැත්වීම.
ii. සිල් මැණියන්වහන්සේලා ලියාපදිංචි කිරිම හා හැඳුනුම්පත් නිකුත් කිරිම.
iii. සිල්මාතා ආරාම දායක සභා ලියාපදිංචි කිරිමේ කටයුතු.
iv. ජාතික සිල්මාතා ජාතාක මණ්ඩල රැස්වීම් - 06
v. ලේඛකාධාර යටතේ පොත්මිලදී ගැනීම.
vi. දහම් පාසල් සඳහා ආධාර සැපයීම.

vii. රාජ්‍ය බෞද්ධ සංගම්, විහාරස්තාන කාර්ය සාධක සමිති, දායක සභා සහ විහාරස්ථ ශාසනාරක්ෂක මණ්ඩල ලියාපදිංචි කිරිමේ කටයුතු.
viii. ශාසනාරක්ෂක මන්ඩල කටයුතු ප්‍රවර්ධනය කිරිම.
ix. සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල රැස්වීම් - 12.
x. නිදහස පිරිත - පෙබරවාරි.
xi. විහාරස්ථාන සදහා දුරකථන, විදුලිය හා ජලය සහනදායී පදනම මත ලබා දීම.
xii. රාජ්‍ය වෙසක් උත්සවය මැයි 17,18
xiii. ශ්‍රී සංඝමිත්තා මහරහත් තෙරණින් වහන්සේලාගේ ගුණ සමරු උළෙල -දෙසැම්බර්
xiv. උපසම්පදා අපේක්ෂිත ස්වාමින් වහන්සේලාට ගමන් වියදම් දීමනා ලබා දීම.
xv. ආදාහන පූජෝත්සව ආධාර ලබා දීම.
xvi. සිව්පස ආධාර ලබා දීම.

# ව්‍යාපෘති අංශය


බෞද්ධ කටයුතු කොමසාරිස් ( දහම් පාසල් )
ශාඛා ප්‍රධාන
සංවර්ධන නිළධාරි 04
කාර්යාල කාර්ය සහායක

## 05.1. දහම් පාසල් ගුරු කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන



දහම් පාසල් ගුරු සේවයට පිවිසෙන බොහෝ දෙනා අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙළ) මට්ටමේ අධ්‍යාපන සුදුසුකම් සහිත පිරිසකි. එම පිරිස විවාහය, රැකියාව, උසස් අධ්‍යාපනයට යොමු වීම වැනි විවිධ සාමාජීයීය සාධක මත දහම් පාසල් ගුරු සේවයෙන් ඉවත්වන අතර නව පිරිසක් දහම් පාසල් ගුරු සේවයට එක් වේ. ඒ අනුව සෑම අවස්ථාවකම මේ සඳහා එක්වන පිරිස නවකයින් වේ. මෙම ගුරු භවතුන් ගුරු පුහුණුවක් නොලද පිරිසක් වන බැවින් ගුරු භූමිකාවට සරිලන පරිදි පුහුණු කළ යුතුව ඇත. එමෙන්ම දරුවන් සමග කටයුතු කිරීමේ දී දරුවන්ගේ මානසික මට්ටම් හා හැකියාවන් හදුනාගෙන කටයුතු කිරීම අනිවාර්ය වූවකි. එසේ නොවන්නේනම් සිදු වන්නේ අගතියකි. එම කරුණු ද පදනම් කරගෙන දහම් පාසල් ගුරුවරයාගේ දැනුම, ආකල්ප කුසලතාවන් ද වර්ධනය කෙරෙන ව්‍යාපෘතියක් වශයෙන් මෙම දහම් පාසල් ගුරු කුසලතා සංවර්ධන ව්‍යාපෘතිය සකස් කර ඇත. එමගින් දහම් පාසල් ගුරුවරුන්ගේ කාර්යභාරය වඩාත් විශිෂ්ටත්වයට,ප්‍රවීණත්වයට පත් කිරීම හා දහම් පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක භාවය තවදුරටත් වැඩි දියුණු කිරීම ද අපේක්ෂා කෙරේ.

2018 වර්ෂයට මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් වූ මුදල රු.4500,00.00 කි. දිස්ත්‍රික්ක 05 ක පැවැත් වූ ගුරු පුහුණු වැඩමුළු ගණන 32 කි. එමගින් පුහුණු කළ ගුරු භවතුන් ගණන 6800 කි. මේ සඳහා ගිය වියදම 557,9480.00 කි.

**5.2 දහම් සරසවිය බුද්ධධර්ම ඩිප්ලෝමා උසස් පාඨමාලාව (පළමුවසර ) - 2018**

**2018 වර්ෂය සඳහා වෙන්ව ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු.7,000,000/-**

**2018.12.31 වන දිනට වියදම් සාරාංශය.**

- 2018.03.24 වන දින දිවයින පුරා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 19 ක අධීක්ෂණය යටතේ මධ්‍යස්ථාන 26 ක දී දහම් සරසවිය බුද්ධධර්ම උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ ( පළමු වසරේ ) අධ්‍යයන කටයුතු ආරම්භ කර ඇත.
- පාඨමාලාවේ සමාරම්භක උත්සවයේ සංග්‍රහ කටයුතු වෙනුවෙන් එක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට රු.3000/- බැගින් වන පරිදි දි.ලේ.කා 19 සඳහා **රු.57,000/-** ක මුදලක් වෙන්කර යවා ඇත.
- පාඨමාලවේ විෂය නිර්දේශය ඇතුළත් ගොණු 4000 ක් පමණ සකසා පාඨමාලා ලාභී දහම් පාසල් ගුරු භවතුන් වෙත ලබාදීමට අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත බාරදීමට කටයුතු කෙරිණි.
- 2018.03.16 දින කොළඹ .07 බෞද්ධාලෝක මාවතේ පිහිටි ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී සම්පත්දායක මාර්ගෝපදේශන වැඩසටහන පැවැත්විණි.එහිදී සම්පත්දායක පත්වීම් ලිපි ලබාදීමට කටයුතු කෙරිණි.
- පාඨමාලාව පැවැත්වෙන මධ්‍යස්ථාන වෙත එම මධ්‍යස්ථානවල පොදු පහසුකම් වෙනුවෙන් එක් මාසයක් සඳහා රු.1500/- බැගින් වන පරිදි මාස 08 ක් වෙනුවෙන් රු.12,000/- ක මුදලක් වෙන් කෙරිණි. ඒ අනුව වෙන්කරන ලද මුළු මුදල **රු.312,000/-**
- පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය මගින් ඉදිරිපත් කර තිබූ සංශෝධිත ඇස්තමේන්තුවට අනුව රු.3,872,250/- ක මුදල අනුමත කෙරිණි.
- මධ්‍යස්ථාන 26 ක් වෙත සම්පත්දායක දීමනා ගෙවීම වෙනුවෙන් අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත **රු.2,340,000/-**ක මුදලක් වෙන් කෙරිණි.
- 2019 වර්ෂයේ පැවැත්වීමට නියමිත දහම් සරසවිය බුද්ධධර්ම ඩිප්ලෝමා උසස් පාඨමාලාවේ දෙවන වසර සඳහා ඇස්තමේන්තුව සකස් කිරීමට කටයුතු කෙරිණි. එහි මුළු මුදල රු.12,679,500/- කි.
- 2016 දහම් සරසවිය බුද්ධධර්ම ඩිප්ලෝමා පාඨමාලාවේ විභාග කටයුතු 2017.සැප්තැම්බර් මස 23,24,හා 30 යන දිනවලදී පවත්වන්නට යෙදුණ අතර එම විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීමට ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය මගින් කටයුතු කර ඇත. ඒ අනුව විභාගය සමත් සංඛ්‍යාව 861 කි. අසමත් සංඛ්‍යාව 309 ක් වේ.
- මෙම පාඨමාලාවට සමගාමීව එක්දින ප්‍රායෝගික භාවනා පුහුණු පාඨමාලාව ආරම්භ කර ඇත. ඒ සඳහා ගම්පහ / කොළඹ/ කළුතර/රත්නපුර/කෑගල්ල යන දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත රු. **256,000/-** ක මුදලක් වෙන්කර ඇත. සම්පත් දායක පිරිකර හා ගමන් වියදම් දීමනා වශයෙන් **රු.32,400 /-** ක මුදලක් වැයකර ඇත. ඉන්ධන වියදම **රු.17,000/- කි.**
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් 2018. අගෝස්තු මස 3/4/5 යන දිනවලදී දහම් සරසවිය ඩිප්ලොමා පාඨමාලාවේ පුනර් විභාගය පැවැත්වීමට කටයුතු කෙරිණි.සිසුන් 70 දෙනෙකු ඒ සඳහා සහභාගී වී ඇත. එහි වියදම වශයෙන් රු.1,184,405/- ක ඇස්තමේන්තුව අනුමත කර ඇත. එම මුදල 2015 පාඨමාලාව සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙත වෙන්කරන ලද මුදලින් ඉතිරිවී ඇති රු.1,940,717.60 ක මුදලින් ප්‍රතිපූරණය කර ගැනීමට දැන්වා ඇත.
- පාඨමාලාලාභී දහම් පාසල් ගුරු භවතුන් වෙත පාඨමාලාවේ විෂය ඇතුළත් පාඨග්‍රන්ථ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කර ලබාදීමට සැලසුම් කර ඇති අතර එම ග්‍රන්ථ **15,000 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් වැයවන මුළු මුදල වන රු.989,000.00 ක මුදල රජයේ මුද්‍රණාලය වෙත වෙන්කර යවා ඇත.**

- 2018 වර්ෂයේ පාඨමාලාව **සඳහා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය වෙත ලබා දීමට නියමිතව තිබූ ඉතිරි මුදල වන රු.1,472,250/- ක මුදල ගෙවීමට කටයුතු කර ඇත.** ඒ අනුව ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු මුළු මුදල ගෙවා අවසන් කර ඇත.

- 2019.01.12,13,19 යන දිනවල පැවැත් වීමට නියමිතව තිබූ දහම් සරසවිය ඩිප්ලෝමා **පරීක්ෂණයේ අනුමත ගෙවීම් වෙනුවෙන් රු.401,900.00 ක මුදල** දි.ලේ.කාර්යාල 13 ක් වෙත ලබා දීමට කටයුතු කර ඇත.

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් පවත්වන ලද පුනර්පරීක්ෂණය සමත් ඩිප්ලෝමා ලාභීන් 100 ක් වෙනුවෙන් ඩිප්ලෝමා සමර්පණෝත්සවය 2019.01.20 වන දින පැවැත් වීමට කටයුතු සූදානම් කර ඇති අතර එහි **වියදම් වශයෙන් ඉල්ලා තිබූ රු. 204,750.00 ක මුදල අනුමත කෙරිණි.**

### 5.3 සංක්ෂිප්ත ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදනය හා මුද්‍රණය කිරීම

සම්බුද්ධ ජයන්ති සිංහල ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව ලියා අවසන් කිරීමෙන් පසු ඉදිරිපත් වූ පාඨක ප්‍රතිචාර මත 1993 වර්ෂයේදී ත්‍රිපිටකය ලිහිල් බසින් ලිවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. ඒ අනුව 2018 වර්ෂයේදී බුද්ධ ජයන්ති සූත්‍රපිටක සිංහල පොත් 33 ග්‍රන්ථ ලිහිල් බසින් සකස් කර ග්‍රන්ථ 27 ලෙස මුද්‍රණය කර අවසන් කරන ඇත. තවද අභිධර්ම පිටකයේ ග්‍රන්ථ දෙකක කටයුතු ආරම්භ කර ගෙනයමින් පවතී.

**2018 වර්ෂය සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු. 3,500,000/-**

| | |
|---|---|
| අනුමත දීමනා වෙනුවෙන් | රු. 1,490,000/- |
| දානමය කටයුතු වෙනුවෙන් | රු. 312,140.56 |
| ග්‍රන්ථ සම්පාදන කටයුතු වෙනුවෙන් | රු. 1,049,375.00 |
| • **එකතුව =** | **රු. 2,851,515.56** |

### 05. 4. බෞද්ධ විශ්ව කෝෂය

බෞද්ධ විශ්ව කෝෂයේ සුචි වෙළුම සකස් කිරීමේ කටයුතු 2018/01/02 දින සිට කොන්ත්‍රාත් පදනමින් බඳවාගත් කාර්ය මණ්ඩලයක් යටතේ ක්‍රියාත්මක වෙමින් පවතී.

### 05.05. දහම් පාසල් ගුරු හැඳුනුම්පත් සැකසීම.


පරපුරෙන් පරපුරට නිර්මල බුදුදහමේ හරය දයාද කිරීමේ මූලස්ථානය දහම් පාසලයි. බුදු දහමින් පෝෂිත සරපුරක් බිහි කිරීමට ඇප කැපව, නිශ්සරණධ්‍යාශයෙන් කටයුතු කරන දහම්පාසල් ගුරු භවතුන් දිරිමත් කිරීමට හා ඔවුන්ට ගෞරවාන්විත සමාජ පරිසරයක් ගොඩනැගීම පිණිස දහම් පාසල් ගුරු හැඳුනුම්පත් නිකුත් කිරීම සිදු කරනු ලබයි. 2017 වසරේ අගෝස්තු මස දක්වා දහම් පාසල් ගුරු හැඳුනුම්පත් 1640 ක ප්‍රමාණයක් රු. 131,710.32 ක වියදමින් සකස් කර ඇත.

2019 වර්ෂයේදී ඉටු කිරිමට අපේක්ෂිත වැඩසටහන

1. අපේක්ෂිත වැඩසටහන්

| | | |
|---|---|---|
| 1. | සංක්ෂිප්ත ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදකමණ්ඩල රැස්වීම් | - 07 |
| 2. | දහම් ගුරු කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන් | - 29 |
| 3. | දහම් පාසල් 10 නව පෙළපොත සංස්කරණ කමිටුවේ රැස්වීම් | - 13 |
| 4. | බුද්ධ රශ්මි වෙසක් ප්‍රදර්ශනය - අරලියගහමන්දිරය | - 01 |
| 5. | දහම් පාසල් දින උත්සවයට සමගාමී බෞද්ධ ප්‍රදර්ශනය | - 01 |
| 6. | දහම් සරසවිය පලමු වසර ඩිප්ලෝමා විභාගය ( ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය ) | - 03 |
| 7. | විභාග | |
| | දහම් සරසවිය පලමු වසර ඩිප්ලෝමා විභාගය ( ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය ) | - 03 |

# භික්ෂු ලියාපදිංචි අංශය


සහකාර කොමසාරිස්
අංශ ප්‍රධාන
සංවර්ධන නිළධාරි 05
රාජ්‍ය කළමණාකාර සහකාර 01
කාර්යාල කාර්ය සහයක

## 06.1. සාමණේර / උපසම්පදා සහතික නිකුත් කිරිම සහ භික්ෂු හැඳුනුම්පත් ලබා දිම.

මෙම අංශය මඟින් සිදුවන සේවාවන්........

- ❖ නව සාමණේර ප්‍රකාශ පත්‍ර ලියාපදිංචි කිරිම.
- ❖ නව උපසම්පදා ප්‍රකාශ පත්‍ර ලියාපදිංචි කිරිම.
- ❖ උපැවිදි සහතික නිකුත් කිරිම .
- ❖ සාමණේර සහ උපසම්පදා ප්‍රකාශ පත්‍ර වල අවශ්‍ය සංශෝධන සිදු කිරිම.
- ❖ ලියාපදිංචි කරන ලද සාමණේර සහ උපසම්පදා ප්‍රකාශ පත්‍ර වල සහතික පිටපත් නිකුත් කිරිම.
- ❖ නීතිමය ගැටලු වල දී අවශ්‍ය සාක්ෂි ලබා දීම.
- ❖ භික්ෂු හැඳුනුම්පත් නිකුත් කිරීම.


2018.01.01 සිට 2018.08.31දින දක්වා

ලියාපදිංචි කරන ලද සාමණේර ස්වාමින් වහන්සේලා සංඛ්‍යාව - 3763
ලියාපදංචි කරන ලද උපසම්පදා ස්වාමින් වහන්සේලා සංඛ්‍යාව - 1268
නිකුත් කරන ලද උපැවිදි සහතික සංඛ්‍යාව - 1158
නිකුත් කරන ලද හැඳුනුම්පත් සංඛ්‍යාව - 1386

එමෙන්ම මෙම අංශය මඟින් සාමණේර හා උපසම්පදා ස්වාමින් වහන්සේලාගේ තොරතුරු පරිගණක ගත කිරිම සඳහා පරිගණක මෘදුකාංගයක් නිර්මාණය කර ඇත.එම මෘදුකාංගය මඟින් දැනට උපසම්පදා භික්ෂූන් වහන්සේලාගේ තොරතුරු 17,100 ක් ද සාමණේර ස්වාමින් වහන්සේලාගේ තොරතුරු 38,720 ක් ද,දත්ත පද්ධතිය වෙත ඇතුලත් කැ ඇත.

මෙමගින් සාමණේර සහ උපසම්පදා සහතික පත් ඉල්ලුම් කරන අයට එම සහතික පත් ඉක්මනින් නිකුත් කිරීමට අවස්ථාව සැලසි ඇත.

# තොරතුරු අංශය


සහකාර
කොමසාරිස්
අංශ
ප්‍රධාන
සංවර්ධන නිළධාරී
03
කාර්යාල කාර්ය
සහායක

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ තොරතුරු අංශය ස්ථාපිත කරන ලද්දේ 2015 පෙබරවාරි 14 වන දින වුව ද, පසුගිය වසර 07 පුරාම තොරතුරු අංශය මඟින් දෙපාර්තමේන්තුවට ඉටු විය යුතු සේවය සිදු විය.

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ තොරතුරු අංශයෙහි ප්‍රධාන කාර්යය වන්නේ දෙපාර්තමේන්තුව සතු විවිධ තොරතුරු හා සංඛ්‍යා ලේඛන සකස් කිරීම, ඒකරාශී කිරීම, යාවත්කාලීන කිරීමයි. එම තොරතුරු නිසි පරිදි සකස් කොට රාජ්‍ය හා පුද්ගලික අංශය වෙත මුදාහැරීමත් මෙමඟින් සිදු වේ. මෙම අංශය මඟින් සිදු කරනු ලබන කාර්යයන් පහත පරිදි වේ.

## 07.1. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත

විවිධ අවශ්‍යතාවන් සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කරන සියලු දෙනා වෙත 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අනුවතොරතුරු නිකුත් කිරීම සිදුකරනු ලබයි. ඒ අනුව 2018.12.310 දිනට ඉල්ලීම් 87 ඉටුකර ඇත.

## 07. 2. විහාරස්ථාන තොරතුරු පරිගණකගත කිරීම.

බුද්ධ ශාසන අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ අංශයේ ද සහාය ඇතිව තොරතුරු කළමනාකරණ දත්ත පද්ධතියක් සකස් කොට ඇති අතර මෙම තොරතුරු කළමනාකරණ දත්ත පද්ධතියට නිසි අයුරින් තොරතුරු ඇතුළත් කිරීම මත විහාරස්ථානය අයත් නිකාය පාර්ශ්වය, වැඩ සිටින ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව, එම ස්වාමීන් වහන්සේලා අතරින් සාමණේර හා උපසම්පදා ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව, දහම් පාසල, පිරිවෙන, විහාරස්ථාන සතු විවිධ සමිති සමාගම්, විහාරස්ථානය මඟින් සිදුකරන විවිධ වැඩසටහන් ආදි වශයෙන් විවිධ ඒකක යටතේ සවිස්තරාත්මක තොරතුරු ලබා ගැනීමට හැකියාව ඇත. මෙම තොරතුරු නිරන්තරයෙන් යාවත්කාලීන කිරීමේ කටයුතු ද තොරතුරු අංශය මඟින් සිදුකරයි.

ඉදිරියේදි මෙම තොරතුරු පද්ධතිය ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් යාවත්කාලින කිරීමත් අන්තර්ජාලය හරහා විහාරස්ථාන තොරතුරු ලබා ගැනීමේ හැකියාවත් සැපයීමට කටයුතු සැලසුම් කර ඇත.

## 07.3. විහාරස්ථාන තොරතුරු යාවත්කාලීන කිරීම

ශ්‍රී ලංකාවේ සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සියලු නිකාය පාර්ශ්වවල විහාරස්ථාන පිළිබඳ තොරතුරු යාවත්කාලීන කිරීම සිදු කෙරිණි.

| දිස්ත්‍රික්කය | ලියාපදිංචි විහාරස්ථාන සංඛ්‍යාව | අයදුම්පත් ඉදිරිපත් කර ඇති විහාරස්ථාන සංඛ්‍යාව(අඩුපාඩු සහිත) | අයදුම්පත් ඉදිරිපත් නොවූ විහාරස්ථාන සංඛ්‍යාව | දිස්ත්‍රික්කවල එකතුව | ක්‍රියාත්මක දහම්පාසල් | සමස්ථ ගුරුවරුන් සංඛ්‍යාව | ශිෂ්‍යයන් |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | 762 | 96 | 25 | 883 | 662 | 11256 | 220979 |
| ගම්පහ | 666 | 150 | 22 | 838 | 759 | 11425 | 233907 |
| කළුතර | 540 | 136 | 16 | 692 | 587 | 8213 | 152473 |
| ගාල්ල | 735 | 89 | 20 | 844 | 674 | 8878 | 148418 |
| මාතර | 516 | 104 | 12 | 632 | 539 | 7134 | 125318 |
| හම්බන්තොට | 419 | 88 | 29 | 536 | 433 | 5297 | 94871 |
| මහනුවර | 809 | 191 | 65 | 1065 | 857 | 10552 | 171957 |
| මාතලේ | 328 | 97 | 25 | 450 | 386 | 3895 | 62917 |
| නුවරඑළිය | 263 | 39 | 18 | 320 | 277 | 2823 | 44897 |
| කුරුණෑගල | 1194 | 321 | 96 | 1611 | 1233 | 13497 | 216913 |
| පුත්තලම | 285 | 52 | 8 | 345 | 299 | 3177 | 55673 |
| අනුරාධපුරය | 689 | 170 | 54 | 913 | 747 | 7591 | 131552 |
| අම්පාර | 153 | 43 | 4 | 200 | 190 | 2338 | 42284 |
| පොළොන්නරුව | 259 | 50 | 7 | 316 | 293 | 3474 | 63919 |
| ත්‍රිකුණාමලය | 116 | 22 | 11 | 149 | 96 | 1161 | 18135 |
| බදුල්ල | 368 | 115 | 16 | 499 | 481 | 5506 | 95603 |
| මොණරාගල | 291 | 71 | 13 | 375 | 317 | 3821 | 67563 |
| වවුනියාව | 27 | 2 | 1 | 30 | 21 | 233 | 3392 |
| රත්නපුර | 535 | 179 | 20 | 734 | 655 | 7746 | 134819 |
| කෑගල්ල | 590 | 128 | 39 | 757 | 598 | 7192 | 103667 |
| මන්නාරම | 5 | | 4 | 9 | 0 | 0 | 0 |
| යාපනය | 6 | 0 | 3 | 9 | 0 | 0 | 0 |
| කිලිනොච්චිය | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| මුලතිව් | 12 | 2 | | 14 | 12 | 147 | 1844 |
| මඩකලපුව | 16 | 1 | 0 | 17 | 0 | 0 | 0 |
| එකතුව | 9585 | 2146 | 508 | 12239 | 10116 | 125356 | 2191101 |

වගුව **07.2 - 2018/12/31** දිනට ශ්‍රී ලංකාවේ විහාරස්ථාන හා දහම් පාසල් පිළිබඳ තොරතුරු

## 07.4. පාලි භාෂා ප්‍රවර්ධන වැඩසටහන

දහම් පාසල් ක්ෂේත්‍රයෙහි පාලි භාෂා දැනුම ඇති ගුරු භවතුන්ගේ පවතින හිඟයට විසඳුමක් ලෙසින් මෙම වැඩසටහන වාර්ෂිකව සිදු කරනු ලබයි. මෙහිදී පාලි භාෂා දැනුමෙන් දහම් පාසල් ගුරුවරයා පෝෂණය කරමින් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි යෙදවීම මෙහි අපේක්ෂිත අරමුණයි. මීට අමතරව ත්‍රිපිටකය පරිශීලනය සඳහා ළැදියාවක් ඇති කිරීම ද මෙමඟින් සිදු වේ.

පාලි භාෂා දැනුමැති ප්‍රවීණයන් ලවා සකස් කළ විෂය නිර්දේශයක් ඇසුරෙන් සකස් කළ නිබන්ධන පාඨමාලා ලාභීන් වෙත සපයමින් දිවයිනේ දිස්ත්‍රික්ක 17 ක තෝරාගත් මධ්‍යස්ථාන 17 ක දී මෙම පාඨමාලාව සාර්ථකව සිදු කොට විභාගය ද පවත්වන ලදී.

## 07.5. භික්ෂු පුහුණු වැඩසටහන්

සාමණේර ස්වාමින් වහන්සේලාගේ ආකල්ප වර්ධනය කරලීම සඳහා විනයධර ධර්මධර යතිවරයන් වහන්සේලාගේ මගපෙන්වීම මත මෙම භික්ෂු ආකල්ප ප්‍රවර්ධන වැඩසටහන සිදුකරයි. නේවාසික පුහුණු වැඩසටහනක් වශයෙන් තෙදිනක් පුරා පැවැත්වෙන මේ තුළ සම්ප්‍රදායානුකූල පිරිත් දේශනා හා ධර්ම දේශනා පුහුණුව, භාවනා ක්‍රමයන් පිළිබඳ දැනුම ලබා දීම, ශාසනික වත් පිළිවෙත් ප්‍රගුණ කිරීම ආදි භික්ෂූන් වහන්සේ නමකට අවශ්‍ය දැනුම සහ පුහුණුව ලබාදීම සිදුකරයි. 2018 වර්ෂයේ රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමීව කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොල ශ්‍රී සුමංගල පිරිවෙණේ දී භික්ෂු පුහුණු වැඩසටහනක් සිදුකරන ලදී.

## 07.6. මාධ්‍ය කටයුතු


දෙපාර්තමේන්තුවේ විවිධ වැඩසටහන් සඳහා අවශ්‍ය මාධ්‍ය ප්‍රචාරය ලබාදීම, මාධ්‍ය වෙත තොරතුරු සැපයීම, මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම හා බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් තුමාගේ සුබ පැතුම් පණිවුඩ නිකුත් කිරීම ද සිදුකරනු ලබයි.

## 07.7. දිනපතා පුවත්පත් වාර්තා

දිනපතා පුවත්පත් වලින් අනාවරණය කරන විවිධ වාර්තා සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය කටයුතු සඳහා සහාය දීම, වාර්තා තහවුරු කරගැනීම පිණිස විවිධ පාර්ශවයන් වෙතින් වාර්තා ලබාගැනීම සිදුකරයි.

විශේෂයෙන් බුදු දහමට නිගරු කරන ආකාරයේ වාර්තා හා ඡායාරූප සම්බන්ධයෙන් කටයුතු කිරීමත්, විහාරස්ථාන හා භික්ෂූන් වහන්සේලා වෙත සිදුවන විවිධ චෝදනා, අපහාස, අපකීර්ති හා ශාසනික අර්බුදකාරී වාර්තා සම්බන්ධයෙන් අතිගරු මහානායක ස්වාමීන් වහන්සේලා දැනුවත් කිරීමත් වාර්තා සැපයීමත් සිදුකරයි.


# මුදල් අංශය


ප්‍රධාන ගනකාධිකාරි
ගණකාධිකාරි
ශාඛා ප්‍රධාන
සංවර්ධන නිළධාරි 04
රාජ්‍ය කළමණාකාර සහකාර 05
කාර්යාල කාර්ය සහයක

| **CATEGORY : ADVANCE ACCOUNTS (2018)** | | | | | | | | **Form : C** | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Financial Performance (Rs. In .000)<br>Rs. 000 | | | | | Physical Performance | | | | |
| Description | Current Year | | Previous Year Actual | Variations Over | | Output(Service/Goods) | | Current Year.s output | | Previous Years Output Actual |
| | Prescribed | Actual | | Prescribed | Previous Year Actual | Type/class | Measure | Targeted | Actual | |
| **Type**: Advance Account | | | | | | Distress Loans | Applicant | | 20,875 | 18,668 |
| | | | | | | Property Loans | Applicant | | - | - |
| **Account Title and No.**: Public Officers Advance Account No 20101 | | | | | | Vehicle Loans | Applicant | | - | - |
| | | | | | | Indebt Loans | Applicant | | - | - |
| - | | | | | | Bicycle Loans | Applicant | | - | - |
| Maximum Expenditure Limit | 35,000 | 17,456 | 30,671 | (17,456) | (13,215) | Festival Loans | Applicant | | 5,386 | 5,270 |
| Minimum Receipt Limit | 18,500 | 19,064 | 18,675 | 564 | 389 | Special Loans | Applicant | | 392 | 416 |
| Maximum Debit Limit | 68,000 | 58,475 | 46,868 | 9,525 | 11,607 | Special Loan Advances | Applicant | | 4,018 | - |
| Maximum Liability | | | | | | | | | | |

| CATEGORY : APPROPRIATION ACCOUNT(2018) | | | | | | Form : B | |
|---|---|---|---|---|---|---|---|
| | Financial Performance (Rs. In .000) | | | | | Physical Performance | |
| Description | Current Year | | Previous Year | Variations Over | Previous Year | Output(Service/Goods) | |
| | Budgeted | Actual | Actual | Budgetd | Actual | Type/class | Measure |
| **Programme Title and No** .<br>02 Development Activities<br>**Project Title and No**. :<br>02. Uflifment of Buddhist Activities | | | | | | | |
| **Expenditure :** | | | | | | | |
| **Recurrent Expenditure** | | | | | | | |
| * Personal Emoluments | 328,216 | 317,448 | 314,350 | 10,768 | 2,343 | Personal Emoluments | No.of Employees |
| * Other Recurrent | 960,320 | 815,431 | 748,739 | 144,889 | 7,386 | | |
| Total | 1,288,536 | 1,132,879 | 1,063,089 | 155,657 | 9,729 | | |
| **Capital Expenditure** | | | | | | | |
| * Facilitation of Dhamma School | 25,000 | 24,237 | 18,335 | 763 | 5,902 | | |
| * Facilitation of Sasanarakshaka Mandala | 3,000 | 1,815 | 2,908 | 1,185 | (1,093) | | |
| * Facilitation of Silmatha Arama | 8,000 | 7,350 | 4,851 | 650 | 2,499 | | |
| * Dhamma School Teacher.s Training & DhahamSarasaviya Programmer | 11,500 | 10,084 | 11,386 | 1,416 | (1,302) | | |
| Total | 47,500 | 43,486 | 37,480 | 4,014 | 6,006 | | |
| **Total Expenditure** | **1,336,036** | **1,176,365** | **1,100,569** | **159,671** | **15,735** | | |

# අභ්‍යන්තර විගණන අංශය


ප්‍රධාන
අභ්‍යන්තර
විගණක
සංවර්ධන
නිලධාරි 02
කළමනාකාර
සහකාර
කාර්යාල
කාර්ය සහයක

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සහ උන්නතිය සඳහා දැහැමි බොදු සමාජයක් පවත්වාගෙන යාම වෙනුවෙන්,1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනත මඟින් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීමට සහය වීම මෙම අංශයෙන් සිදු කෙරේ.

2013/07/01 වන දින බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කරන ලදි.

**අරමුණු-:**

- 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තිය යටතේ පවතින සියලුම විහාරස්ථාන හා දේවාල වල විගණන කටයුතු සිදුකිරීම.
- බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සියලුම විගණන කටයුතු සිදුකිරීම.
- අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට සහය වීම.
- මනා ගිණුම් හා මූල්‍ය කළමනාකරණයකට සහය වීම.
- මනා සම්පත් භාවිතය තහවුරු කිරීමට සහය වීම.
- කාර්ය සාධන ඉලක්ක සපුරා ගැනීමට සහය වීම.

අභ්‍යන්තර විගණනය වූ කලී සංවිධානයක් තුළ කෙරෙන ස්වාධීන තක්සේරුවකි. කළමනාකරණ ඒකකයේ සියළුම මට්ටම් වෙතින් ඉටුකරන සේවාවන් හා කාර්යයන් සමාලෝචනය කිරීම ද, මැන බැලීම ඇගයීම හා අභ්‍යන්තර පාලන ක්‍රමයේ සිද්ධි දායක භාවය සම්බන්ධයෙන් වාර්තා කිරීම ද ඊට අයත් වේ. අභ්‍යන්තර විගණනය කළමනාකරණයට සහය වේ.

මෙම අංශය සෘජුව බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත වාර්තා කරන ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ ක්‍රියාත්මක වේ.

<u>අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කෙරෙන සුවිශේෂී කාර්යභාරයන්</u>

01.විහාර දේවාලගම් අඥා පනතේ විධිවිධාන අනුව සිද්ධස්ථානයක පවත්වාගෙන යා යුතු ගිණුම් පොත්පත් පිළිබඳ හඳුන්වා දී ඇති පාලන පද්ධති ශක්තිමත් කිරීම.
02. පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථාන පවතින සම්පත් භාවිතා කරමින් විගණනයට ලක්කිරීම සහ එම සිද්ධස්ථාන සඳහා මාර්ගෝපදේශ ලබාදීම.
03. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.
04.දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශ මඟින් සංවිධානය කරනු ලබන විවිධ වැඩසටහන් සඳහා පූර්ණ දායකත්වය සහ සහයෝගය ලබා දීම.
05. දෙපාර්තමේන්තුව මඟින් සිදුකළ යුතු විශේෂ රාජකාරි සඳහා දායකත්වය ලබාදීම.

## <u>2018 වර්ෂය තුල සිදු කල විගණන වාර්තා පහත දැක්වේ</u>

1. 2017 වර්ෂයේ අත්තිකාරම් ලබා ගැනීම සම්බන්ධ විගණන වාර්තාව (2018/02/20)
2. රංගිරි දඹුලු රජමහා විහාරය සම්බන්ධ විගණන වාර්තාව (2018/02/16)
3. දෙල්දෙණිය රජමහා විහාරය (2018/03/15)
4. හිඳගල රජමහා විහාරය (2018/03/20)
5. තල්වත්ත ගංගාරාම රජමහා විහාරය (2018/03/21)
6. රංගිරි දඹුලු රජමහා විහාරය (2018/04/23)
7. නවගමුව ශ්‍රී සුගතබිම්බාරාමය (2018.05.06)
8. අත්තනගල්ල පහළ රජමහා විහාරය (2018.06.20)
9. සපරගමුව මහා සමන් දේවාලය (2018.07.12)
10. හොරණ රජමහා විහාරය (2018.07.25)
11. වාරණ රජමහා විහාරය (2018.08.06)
12. සොරගුණේ කුඩා කතරගම දේවාලය (2018.08.20)

13. අත්තනගල්ල ඉහළ රජමහා විහාරය (2018.09.04)
14. රංගිරි දඹුලු රජමහා විහාරයේ ඉතිරිකිරීමේ ගිණුම සම්බන්ධ වාර්තාව (2018.09.12)
15. බදුල්ල කතරගම දේවාලය (2018.09.19)
16. බදුල්ල පත්තිනි දේවාලය (2018.09.19)
17. ගැටඹේ රජෝපවනාරාමය (2018.09.20)
18. කොටබෝව කුඩා කතරගම දේවාලය (2018.10.05)
19. කෝට්ටේ රජමහා විහාරය (2018.10.08)
20. විල්බාව රජමහා විහාරය (2018.11.01)
21. අම්බොක්ක ශ්‍රී පත්තිනි දේවාලය (2018.11.09)
22. සීනිගම ශ්‍රී දෙවොල් මහා දේවාලය (2018.12.03)
23. වේගිරිය ශ්‍රී නාථ දේවාලය (2018.12.03)
24. ශ්‍රී මහා පත්තිනි දේවාලය (2018.12.06)
25. ශ්‍රී මහා නාථ දේවාලය ( 2018.12.10)
26. එළමල්දෙණිය රජමහා විහාරය (2019.12.31)

අභ්‍යන්තර විගණන අංශය මඟින් විගණන කටයුතු සිදුකෙරෙන විහාරස්ථාන සහ දේවාල පහත පරිදි වේ.

| කාර්යාලය | 4(1) යටතේ පාලනය වන විහාරස්ථාන | 4(1) යටතේ පාලනය වන දේවාල | **එකතුව** |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | 116 | 08 | **124** |
| රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය | 30 | 09 | **39** |
| මහනුවර ප්‍රාදේශීය කාර්යාලයට | 71 | 20 | **91** |
| **එකතුව** | **217** | **37** | **254** |

ප්‍රධාන කාර්යාලය මඟින් පාලනය වන සිද්ධස්ථාන

| දිස්ත්‍රික්කය | 4(1) යටතේ පාලනය වන විහාරස්ථාන | 4(1) යටතේ පාලනය වන දේවාල |
|---|---|---|
| කොළඹ | 08 | - |
| ගම්පහ | 14 | - |
| කළුතර | 07 | - |
| ගාල්ල | 07 | 01 |
| මාතර | 20 | 01 |
| කුරුණෑගල | 43 | 06 |
| හම්බන්තොට | 13 | - |
| අනුරාධපුර | 04 | - |
| **එකතුව** | **116** | **08** |


මහනුවර ප්‍රාදේශීය කාර්යාලය මඟින් පාලනය වන සිද්දස්ථාන

| දිස්ත්‍රික්කය | 4(1) යටතේ පාලනය වන විහාරස්ථාන | 4(1) යටතේ පාලනය වන දේවාල |
|---|---|---|
| මහනුවර | 42 | 13 |
| මාතලේ | 07 | 01 |
| කෑගල්ල | 17 | 03 |
| නුවරඑළිය | 03 | 02 |
| බදුල්ල | 02 | 01 |
| **එකතුව** | **71** | **20** |

රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය මගින් පාලනය වන සිද්ධස්ථාන

| දිස්ත්‍රික්කය | 4(1) යටතේ පාලනය වන විහාරස්ථාන | 4(1) යටතේ පාලනය වන දේවාල |
|---|---|---|
| රත්නපුර | 16 | 04 |
| මොණරාගල | 09 | 02 |
| බදුල්ල | 05 | 03 |
| **එකතුව** | **30** | **09** |

# බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ
# ප්‍රාදේශීය කාර්යාල- රත්නපුර


සහකාර කොමසාරිස්
අංශ ප්‍රධාන
සංවර්ධන නිළධාරි 03
රාජ්‍ය කළමණාකාර සහකාර 03
කාර්යාල කාර්ය සහයක

| පාලන බල ප්‍රදේශය | රත්නපුර, මොණරාගල, බදුල්ල යන දිස්ත්‍රික්කවල 1931 අංක 19 දරණ බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ (4) 1 සහ (4) 2 වගන්ති යටතේ පාලනය වන විහාරස්ථාන හා දේවාල ඇතුළත් වේ. |
|---|---|

| දිස්ත්‍රික්කය | (1) 4යටතේ පාලනය වන සිද්ධස්ථාන | (2) 4යටතේ පාලනය වන සිද්ධස්ථාන |
|---|---|---|
| රත්නපුර | 20 | 548 |
| මොණරාගල | 11 | 362 |
| බදුල්ල | 08 | 391 |
| **එකතුව** | **39** | **1301** |

මෙම සිද්ධස්ථාන වලට අදාළ සියළු කටයුතු 1931 අංක 19 දරණ බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ විධි විධානයන්ට අනුව රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය මඟින් සිදු කරනු ලබයි. එම සේවාවන් අතර,

- විහාරස්ථාන සඳහා භාරකරුවන්, බස්නායක නිලමේවරුන් පත්කිරීමට සහය වීම.
- සිද්ධස්ථානවල දේපල භාරකරුවන්ට භාර දීම.
- විහාර දේවාල සතු ඉඩම් බදු දීම.
- වාර්ෂික ගිණුම් වාර්තා ගෙන්වා ගැනීම,පරීක්ෂා කිරීම,මුදල් නිදහස් කිරීම
- විහාරස්ථාන සම්බන්ධ ආරවුල් නිරවුල් කිරීමට අදාළ කටයුතු කිරීම.
- රුහුණු මහා කතරගම දේවාලයේ පෙරහැර කටයුතු සඳහා සහය වීම.
- පඩුරු මුදල් සම්බන්ධ අධීක්ෂණ කටයුතු.
- ඉඩම් ගැටළු විසඳීම සඳහා සහය වීම.
- දැව හෙළීමට හා ප්‍රවාහනයට නිර්දේශ ලබා දීම.
- මැණික් බල පත්‍ර සඳහා නිර්දේශ ලබා දීම.
- අපවත් වූ ස්වාමීන් වහන්සේලාගේ බැංකු ගිණුම් සම්බන්ධව කටයුතු කිරීම.
- පැමිණිලි හා අභියාචනා සම්බන්ධ කටයුතු කිරීම ආදිය ප්‍රධාන තැනක් ගනී.

| අනු අංකය | රාජකාරි කටයුතු | දිස්ත්‍රික්කය | | | |
|---|---|---|---|---|---|
| | | රත්නපුර | බදුල්ල | මොණරාගල | මුළු ගණන |
| **01** | භාරකරුවන් පත් කිරීම (අදාල තොරතුරු විභාදේඅංශයට . (.යොමු කිරීම පමණක් සිදුකෙරේ | 06 | - | 02 | 08 |
| **02** | ඉඩම් බදු දීම | 190 | 300 | 110 | 600 |
| **03** | බදු මුදල් සංශෝධනය | 45 | 370 | 58 | 473 |
| **04** | දැව හෙළීම හා ප්‍රවාහනයට බලපත්‍ර නිකුත් කිරීම | 190 | - | 220 | 410 |
| **05** | අපවත් වී වදාළ ස්වාමීන් වහන්සේලා සතු බැංකු මුදල් නිදහස් කිරීම | 30 | 20 | 07 | 57 |
| **06** | පූජා ඔප්පු දීමට අනුමැතිය ලබා දීම | 03 | - | 02 | 05 |
| **07** | වන්දි මුදල් හා පොලී මුදල් නිදහස් කිරීම | 03 | 02 | 02 | 07 |
| **08** | විහාරස්ථාන සතු ඉඩම් හා වෙනත් ගැටලු නිරාකරණය කිරීම | 105 | 105 | 95 | 305 |
| **09** | මැණික් ගැරීමට බලපත්‍ර ලබා දීම නිර්දේශ කිරීම | 201 | 20 | 05 | 226 |
| **10** | මැණික් ගැරීමට දී ඇති බලපත්‍ර දීර්ඝ කිරීමට නිර්දේශ කිරීම | 150 | - | 03 | 15 |

අනුමාන අය වැය වාර්තා සහ අර්ධ වාර්ෂික අය වැය වාර්තා කලට වේලාවට නොඑවන සහ ප්‍රමාද වී එවනු ලබන භාරකරුවන්ට හා බස්නායක නිලමේවරුන් දැනුවත් කිරීම ලිපි මඟින් සිදු කර ඇත. මෙම කාර්යාලය මඟින් සිදු කරන ක්ෂේත්‍ර පරීක්ෂණ හා කාර්යාල පරීක්ෂණ මඟින් සිද්ධස්ථාන වල පවතින ආරවුල් සඳහා විසඳුම් ලබා දීමට පියවර ගෙන ඇත. බදු කරුවන් හා භාරකරුවන් සමඟ සාකච්ඡා කර බදු මුදල් අයකර ගැනීම සඳහා විශේෂ පියවරයන් රැසක් ගෙන ඇත.විශේෂයෙන්ම බදුල්ල පත්තිණි දේවාලයට අයත් ඉඩම්වල අනවසර පදිංචිකරුවන් දීර්ඝකාලීන බදුකර වලට එකඟ කර ගැනීමට අදාලව ක්‍රියාමාර්ග මෙම වර්ෂය තුළ ආරම්භ කර ඇත. බදු ගෙවීම් පැහැර හැරීම්, නීත්‍යානුකූල බදු නොගෙවීම් සහ බදු මුදල් අභියාචනා ගැනද විශේෂ අවධානය යොමු කර කටයුතු කර ඇත.

එසේම සපරගමු මහ සමන් දේවාලයේ හිටපු බස්නායක නිළමේගේ ධූරකාලය 2018/06/17 දිනෙන් අවසන් වීමත් සමඟ නව බස්නායක නිළමේවරයකු පත්වන තෙක් එම දේවාලයේ කටයුතු බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ පාලනයට ගැනීමත් සමඟ රත්නපුර බෞද්ධ කටයුතු ප්‍රාදේශීය කාර්යාලයෙන් එම දේවාලයේ කටයුතු පාලනය කිරීම සඳහා වැඩි කාර්යභාරයක් ඉටුකරන ලදී. එම කාලය තුළදී සිදු කල නිසි අධීක්ෂණය හා මග පෙන්වීම යටතේ සපරගමුව මහ සමන් දේවාලය සතු අංක එස් ජී කේ එක්ස් 6551 දරණ වාහනයේ ණය වාරික ගෙවා අවසන් කිරීමටද රුපියල් මිලියන 4.5ක් පමණ වූ විදුලි බිල රුපියල් මිලියන 0.3දක්වා අඩු කර ගැනීමටද හැකියාව ලැබුනි.ඉතාම අබලන් තත්වයේ පැවති සපරගමු මහ සමන් දේවාලයේ වහලය ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දීම තුලින් පෞරාණිකත්වය රැකෙන පරිදි අලංකාරවත්ව කඩිනමින් ප්‍රතිසංස්කරණ කටයුතු නිමකර ගැනීමට හැකියාව ලැබුනි.

2018 වර්ෂයේද සිද්ධස්ථාන සතු ඉඩම් බදු දීම සම්බන්ධව හා බදු මුදල් අයකර ගැනීම සම්බන්ධව විශාල ප්‍රගතියක් අත්කරගෙන ඇත.එමෙන්ම 2018 වර්ෂයේදී බදු ගෙවීම් ක්‍රමවත් කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබීය. මෙම කාර්යාලයේ ලිපිගොනු පිළිවෙලට හා එකිනෙකින් පහසුව වෙන්කර හඳුනාගත හැකි පරිදි නව ගොනු කවර සකස්කිරීමේ වැඩපිළිවෙල මෙම වර්ෂයේ ආරම්භ කළ අතර එය ඉදිරියට පවත්වාගෙන යනු ලැබේ.

බදු ලබා දීමේ ක්‍රියාවලිය තුළ මොණරාගල දිස්ත්‍රික්කයේ වත්තේගම රජ මහා විහාරයට අයත් ඉඩම් දීර්ඝ කාලීනව බදු ලබා දීම යටතේ වත්තේගම ප්ලාන්ටේෂන් ආයතනය වෙත අක්කර 2138ක් බදු ලබා දීමට කටයුතු කර ඇත.ඒ තුලින් වර්තමානයේ ප්‍රදේශයේ ජනතාවට රැකියා අවස්ථා රාශියක් උත්පාදනය වී ඇත.එම ව්‍යාපෘතිය සඳහා විශාල ජනතා විරෝධයක් මුල්කාලීනව පැවති අතර ඒ සඳහා පැවති සාකච්ඡා සඳහා සහභාගී වී නිසි කළමනාකාරීත්වයෙන් යුත්තව ගැටළුව විසඳීම නිසා වර්තමානය වන විට එම ප්‍රදේශය ආර්ථික ප්‍රබෝධයකට ලක් වී ඇත.මෙහි වගා කරන සොයා බෝංචි හා උක් වගාව නිසා ජාතික නිෂ්පාදනයට හවුල් වීමට බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවටද හැකි වී ඇත.මේ තුලින් අපද රටේ සංවර්ධන ක්‍රියාවලියට දායක විමේ අවස්ථාවක් උදා වී ඇත.

එමෙන්ම වත්තේගම රජ මහා විහාරයේ ඉඩම් දීර්ඝ කාලීන බදු ලබාගෙන ඇති මැලිබන් ආයතනයද පරිසර හිතකාමී වගාවන් ව්‍යාප්ත කර, නිසි පරිදි ප්‍රයෝජනයට නොගෙන තිබූ ඉඩම් නිසි කළමනාකාරීත්වයක් යටතේ වගා කිරීම තුලින් ඉතාම දුෂ්කර ප්‍රදේශයක් වන වත්තේගම ප්‍රදේශය නව පිබිදීමකට ලක්වී ඇත.ඒ තුලින් මංමාවත් ආදී යටිතල පහසුකම් මෙන්ම ආර්ථිකමය වශයෙන් එහි ජනතාව ශක්තිමත් වීමටද අවකාශ ලැබී ඇත.

වර්තමානය වන විට වත්තේගම හා මුප්පනේ රජ මහා විහාර සතුව පැවති ඉඩම් අක්‍රමවත් අන්දමින් භුක්ති විදීම නවතා ප්‍රදේශයේ ජනතාවද දිර්ඝ කාලීන බදු ක්‍රමවේදයට අනු ගත කිරීමට හැකියාව ලැබී ඇත.ඒ තුලින් විහාරස්ථානයට වාර්ෂිකව රුපියල් මිලියන 6 පමණ ආදායමක් උපයා ගැනීමට හැකියාව ලැබී ඇතිවාක් මෙන්ම විහාරද්ථානය සතු ඉඩම් ආරක්ෂා වීම සංවර්ධනය වීමද සිදු වීඇත.

රුහුණු මහා කතරගම දේවාලයේ කටයුතු නිසි අධීක්ෂණයට ලක් කිරීම තුළ වර්තමානය වන විට විශ්‍රාම ශාලාව බැතිමතුන්ට පහසුකම් සපයමින් ආදායම් උත්පාදනය කරන තත්වයට පත් කිරීමට සමත් වී ඇත. එමෙන්ම රුහුණු මහා කතරගම දේවාලයට අයත් විශාල ඉඩම් ප්‍රමාණයක් පැලවත්ත සීනි සමාගම වෙත දීර්ඝ කාලීන බදු ලබා දීම තුලින් වාර්ෂිකව රුපියල් මිලියන 15 ක පමණ ආදායමක් ලබා ගන්නා අතර ඒ තුලින් සෘජු හා වක්‍ර රැකියා රාශියක් උත්පාදනය වි ඇත. එපමණක්ද නොව රුහුණු මහා කතරගම දේවාලයේ ඉඩම් තුළ උක් වගා කිරීම තුලින් රටේ ආර්ථික සංවර්ධනයට විශාල මෙහෙයක් ඉටු කිරීමට අවස්ථාව උදා වී ඇත.

රුහුණු මහා කතරගම දේවාලයේ හිටපු බස්නායක නිලමේ වරයාගේ වැඩ තහනම් කිරීම හා තාවකාලික භාරකාරයකු පත් කිරීමට අදාලව සිදු කළ යුතු භාණ්ඩ භාරදීමේ කටයුතු හා තාවකාලික භාරකරු අධීක්ෂණයට ලක් කර නිවැරදි අයුරින් කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය මඟ පෙන්වීම නිරන්තර ලබා දීමත් හිටපු බස්නායක නිලමේ වරයාගේ ධුර කාලයට අදාලව විගණකාධිපති දෙපාර්තමේන්තුව මගින් සිදු කරන වෝහාරික පරීක්ෂණයට අදාල තොරතුරු සපයමින් ඒ සඳහා සහයෝගය ලබා දිමද සිදු කර ඇත.

සපරගමුව මහ සමන් දේවාලයේ හා රුහුණු මහා කතරගම දේවාලයේ ගැටළු සම්බන්ධයෙන් අල්ලස් හා දූෂණ විමර්ශන අංශය මගින් සිදු කරනු ලබන පරීක්ෂණ සඳහා සහභාගී වී එම පරීක්ෂණ සිදු කිරීමට අවශය සහයෝගයද ලබා දී ඇත.

දීර්ඝ කාලීන බදු කරුවන්ගේ බදු කාලය ඇපයට තබා ණය ලබා ගැනීමට අවස්ථාව සලසා දීම තුලින් බදු කරුවන් අද වන විට බදු ඔප්පු ලබා ගැනීමට වැඩි නැඹුරුවක් දක්වා ඇත.ණය ලබා ගැනීම තුළින් බදු කරුවන්ද ආර්ථික වශයෙන් දියුණු තත්වයකට පත් වී ඇත.

මෙම වර්ෂය තුළ සපරගමුව මහ සමන් දේවාලය,රුහුණු මහා කතරගම දේවාලය,කිරි වෙහෙර රජ මහා විහාරය ඇතුළු අනෙකුත් සිද්ධස්ථාන වල පඬුරු අධීක්ෂණ කටයුතු 40ක් පමණ සිදු කර ඇත.

| අනු අංක | සිද්ධස්ථානය | වාර්ෂික පඬුරු මුදල් |
|---|---|---|
| 01 | සබරගමු මහ සමන් දේවාලය | 20,325,356.29 |
| 02 | රුහුණු මහා කතරගම දේවාලය | 18178190.00 |
| 03 | කිරිවෙහෙර රජ මහා විහාරය | 30302000.00 |
| 04 | අභිනවාරාම විහාරය | 377320.00 |
| 05 | සෙල්ල කතරගම මහසෙන් විහාරය | 1374575.00 |
| 06 | කොටබෝව කුඩා කතරගම දේවාලය | 296820.00 |
| 07 | බොල්තුඹේ සමන් දේවාලය | 148330.00 |

2018 වර්ෂයේ සපරගමු මහ සමන් දේවාලයෙන් රු.5960552.75ක්ද, ,සංඛපාල රජ මහා විහාරයෙන් රු.807000.00 ක මුදලක්ද එම සිද්ධස්ථාන වල සිදු කල කඩ බිම් වෙන්දේසි තුලින් උපයා දිමට මෙම කාර්යාලයේ නිලධාරීන් සමත් වී ඇත. සපරගමුව මහ සමන් දේවාලයේ පඬුරු ආදායමට අමතරව මැණික් ආදායම හා විදුලි ආධාර රිසිට්පත් ආදායම ගණනය කිරිම 2017 වර්ෂයේ සිට ආරම්භ කළ අතර එම කටයුතු ඉදිරියටත් සිදුකරමින් පවතී.

මෙම කටයුතු ඉටු කිරීම තුළින්බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවට රටේ ආර්ථික ක්‍රියාවලියටද දායක වීමට අවස්ථාව උදා වීම සතුටට කරුණකි.2018 වර්ෂයේදී පෙර වර්ෂවලට වඩා ඵලදායීත්වයෙන් යුක්තව කාර්යක්ෂමව වැඩ කිරීම තුලින් මෙම ප්‍රගතිය අත්කර ගැනීමට හැකි වු බව සිහිපත් කරමි.

## 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත යෝජනා

01.ලිපි ගොණු යාවත්කාලීන කර නිසි පරිදි පවත්වාගෙන යාම

02.කාර්යයන් වඩා ඵලදායිව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා ලිපි ගොණු පරිගණක ගත කිරීම ( ඒ සඳහා අවශ්‍ය පහසුකම් මූලිකව ලබා ගැනීම)

03.බෞද්ධ විහාර දේවාලගම් පනතේ 4(1) වගන්තිය යටතේ පවත්වා රත්නපුර ප්‍රාදේශිය කාර්යාල බල සීමාවට ගැනෙන සිද්ධස්ථාන වඩා සමීපව අධීක්ෂණය කිරීම තුලින්

i.මූල්‍ය කටයුතු විධිමත් ලෙස පාලනය කිරීම

ii.නිවැරදි පරිපාලනයක් ඇති කිරීම

iv.කාර්යයන් වඩා පහසු කිරීම

v.පවතින ආරවුල් කඩිනමින් සමතයකට පත් කිරීම

vi.සිද්ධස්ථානවල ආදායම් තත්වය ඉහල නැංවීම

vii.සිද්ධස්ථානවල මූල්‍ය පාලනය පිළිබඳ ජනතාව අතර පවතින වැරදි ආකල්ප නැති කිරීම

04.සිද්ධස්ථානයේ අනුමාන ආදායම් වියදම් වාර්තා අනුව තත්‍ය අදායම් වියදම් සන්සන්දනය කර එහි යතා තත්වය නිරීක්ෂණය කිරීම තුලින් සිද්ධස්ථානයේ සංවර්ධනයට අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම

05.උපදෙස් පත්‍රිකාවක් සකස් කර භාරකාර ස්වාමීන් වහන්සේලා හා භාරකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කිරීම

06.රත්නපුර ප්‍රාදේශිය කාර්යාලය මගින් පාලනය වන 4 (1) පාලනය යටතේ පවතින සිද්ධස්ථාන සතු ඉඩම් පිළිබඳ සංගණනයක් සිදු කිරීම තුලින්

i.පවතින ඉඩම් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම

ii.අවිධිමත් බදු දීම් නතර කර විධිමත් ලෙස බදු දීම් සඳහා යොමු කිරීම

iii.ඒතුලින් සිද්ධස්ථාන වල ආදායම් තත්වය ඉහල නැංවීම හා නිවැරදි ගණනය කිරීම් සිදු කිරීම


iv.කාර්යයන් වඩා පහසු කර ගැනීම හා ප්‍රමාදයන් අවම කිරීම

07.සිද්ධස්ථානවල ඉඩම් පරිභොජනය කරන පුද්ගලයන් දැනුවත් කර අනවශ්‍ය ප්‍රමාදයන් අවම කර බදු ලබා ගැනීම සඳහා පුද්ගලයන් නැඹුරු කර ගැනීම

08.දෙපාර්තමේන්තුවේ විවිධ කාර්යයන් ඉටු කිරීමේදී පවතින ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡාවක් පැවැත්වීම

ඉදිරියටත් මෙම ආයතන සමඟ සම්බන්ධ වෙමින් රටේ ආර්ථිකයට, සංවර්ධනයට උරදෙමින් සිද්ධස්ථාන සතු දේපල ආරක්ෂා කර සංවර්ධනය කිරීමට හැකි වන පරිදි රත්නපුර බෞද්ධ කටයුතු ප්‍රාදේශිය කාර්යාලය කටයුතු කිරීමට සුදානම්ව සිටින බව කාරුණිකව දන්වා සිටිමි.

# බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ
# ප්‍රාදේශීය කාර්යාල- මහනුවර


බෞද්ධ කටයුතු කොමසාරිස්
අංශ ප්‍රධාන
සංවර්ධන නිලධාරී 08
රාජ්‍ය කළමණාකරණ සහකාර 05
නීති සහකාර නිලධාරී
රියදුරු01
කාර්යාල කාර්ය සහයක

**පාලන බල ප්‍රදේශය -**

මහනුවර, මාතලේ, කෑගල්ල, නුවරඑලිය දිස්ත්‍රික්කයේ මුතියංගණ රජමහා විහාරය, මහියංගණ රජමහා විහාරය, මහියංගණ සමන් දේවාලය ඇතුළත් බෞද්ධ විහාර දේවාල ගම් ආඥා පනතේ 4(1) සහ 4(2) වගන්ති යටතේ පාලනය වන විහාරස්ථාන හා දේවාල ඇතුළත් වේ.

| දිස්ත්‍රික්කය | 4(1) යටතේ පාලනය වන දේවාල | 4(1) යටතේ පාලනය වන දේවාල | 4(1) පාලනය නොවන සිද්ධස්ථාන |
|---|---|---|---|
| මහනුවර | 42 | 13 | 1051 |
| මාතලේ | 07 | 01 | 459 |
| කෑගල්ල | 17 | 03 | 749 |
| නුවරඑළිය | 03 | 02 | 321 |
| බදුල්ල | 02 | 01 | - |
| | 71 | 20 | 2580 |

මෙම සිද්ධස්ථානවලට අදාල සියලු කටයුතු 1931 අංක 19 දරණ බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ විධිවිධාන අනුව මෙම කාර්යාලය මගින් පහත කාර්යයන් සිදු කරනු ලැබේ.

- ශ්‍රී දළදා මාළිගාව, සතර මහා දේවාල හා පිටිසර දේවාල සඳහා දියවඩන නිළමේ සහ බස්නායක නිලමේවරු පත්කිරීමේ ඡන්ද කටයුතු සිදු කිරීම
- පාලනය වන විහාරස්ථාන සහ දේවාල ස දහා භාරකරුවන් පත්කිරීම
- භාරකාර ඇපමුදල් තැන්පත් කිරීම සහ නිදහස් කිරීම
- සිද්ධස්ථානවල දේපල භාරකරුවන්ට භාරදීම
- විහාර දේවාල වලට අයත් ඉඩම් බදු දීම
- ප්‍රවේණි අයිතිවාසිකම් පවරා ගැනීම පිළිබ ද ලේඛන පවත්වා ගෙන යාම
- වාර්ෂික ගිණුම් වාර්තා ගෙන්වා ගැනීම, පරික්ෂා කිරීම, මුදල් නිදහස් කිරීම
- විහාරස්ථාන ආරවුල් සම්බන්ධ කටයුතු සිදු කිරීම
- ශ්‍රී දළදා පෙරහැර, උපසම්පදා කටයුතුවලට සහාය වීම
- දහම් පාසැල් උත්සව කටයුතු හා වෙනත් ආගමික අවස්ථාවන්ට සහභාගී වීම හා සහායවීම යනාදිය වේ.

සිද්ධස්ථානවල කටයුතු ක්‍රමවත්ව පවත්වා ගෙන යාම සඳහා 2017 වර්ෂයට සාපේක්ෂව 2018 මැයි මස 18 වන දින සෙංකඩගල බෞද්ධ බල මණ්ඩලයේදී සිද්ධස්ථාන භාරකරුවන් දැනුවත් කිරීමට සංවිධානය කළ සම්මන්ත්‍රණය මෙවරත් සාර්ථක ලෙස පැවැත්විණි. සිද්ධස්ථානවල ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේදි අප ආයතනයේ වැඩ කටයුතු කරන ගෙන යාමේදි සහාය වන වෙනත් රාජ්‍ය ආයතනවල නිලධාරින්ද සම්බන්ධ කර ගැනීම විශේෂ කරුණක් විය. එසේම ප්‍රධාන කාර්යාලයේ අභ්‍යන්තර විගණකගේ සහභාගීත්වයෙන් සිද්ධස්ථානවල ගිණුම් සහ විගණන කටයුතු නියමිත ආකෘති පත්‍ර යොදා ගනිමින් සටහන් කිරීම පිළිබද දේශනයක්ද පැවැත්විය. තවද පෙර වර්ෂවල මෙන්ම සිද්ධස්ථාවලට ගොස් එකී සිද්ධස්ථානවල පවතින පොදු ගැටලු සම්බන්ධයෙන් අඩු පාඩු මග හරවා ගැනීමට ද මෙකී කාර්යාලය මගින් මග පෙන්වීමක් සිදු කරන ලදි. අනුමාන අයවැය වාර්තා සහ අර්ධ වාර්ෂික අයවැය වාර්තා නිසි කලට නොඑවන සහ ප්‍රමාද කිරීම් සිදු කරන භාරකරුවන්ට ලිපි මගින් දැනුම් දිමද පෙර වර්ෂවල මෙන්ම මෙවරත් සිදු කරමින් යනු ඇත. එසේම සිද්ධස්ථාන වෙත ගොස් අයවැය සකස් කිරීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ කටයුතු පෙර වසරේ මෙන්ම මෙම වසරේද සිදු කර බැව් සඳහන් කරමි. 2018 වර්ෂයේ අනුමාන අයවැය වාර්තා 86ක් දක්වා වර්ධනය කර ගැනීමට හැකි වූ බැව් සඳහන් කරන අතර 2018 වර්ෂයේ අර්ධ වාර්ෂික

අයවැය වාර්තා ලැබීම් ගත් කල පළමු මාස 06 තුල වාර්තා 50ක්ද දෙවන මාස 06 තුල වාර්තා 27ක්ද ලැබී ඇති බවද සඳහන් කරමි.

සිද්ධස්ථාන සඳහා වෙන් වෙන් වශයෙන් බදු ලබා දීම සම්බන්ධව වෙන වෙනම ලේඛනයක් සකස් කොට පවත්වා ගෙන යාම පෙර වර්ෂවල මෙන්ම මෙම වසරේද ක්‍රියාත්මක කර ගෙන යනු ඇත. එකී දත්ත පරිගණක ගත කොට යාවත්කාලීන කිරීම සහ වසර පහෙන් පහට බදු මුදල් සංශෝධනය කිරීම සම්බන්ධ ලිපි ගොනු යාවත්කාලීන කිරීමේ කටයුතු සිදු වෙමින් පවතින බවද සඳහන් කරමි. පෙර වසරේදී ක්‍රියාත්මක වූ රාජකාරී ඉඩම් පිළිබඳ ලේඛනය පවත්වාගෙන යාම නිසා රාජකාරී ඉඩම් පිළිබඳ විධිමත් තොරතුරුද එක් රැස් කර ගත හැකි වූ බවද සටහන් කරමි. එසේම කාර්යාලයේ පැරණි ගොනු යාවත්කාලීන කිරීමේ කටයුතු දැනට සිදු කර ගෙන යන බැව්ද වැඩිදුරටත් දන්වමි. එසේම දැනට සිටින කාර්යය මණ්ඩලයේ සුභ සාධනය උදෙසා පෙර වර්ෂවල මෙන්ම මෙම වර්ෂයේදීද වැදගත් වැඩකොටසක් ඉටු කර ඇති බවද සිහිපත් කරමි.

ඒ අනුව 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ අවසන් වන විට අපේක්ෂා කල වැඩ කටයුතු රාශියක් ප්‍රධාන කාර්යාලයේ මග පෙන්වීමද යටතේ සිදු කර අවසන් කිරීමට හැකි වූ බවද සඳහන් කරමි. කෙසේ වෙතත් 2018 වර්ෂයේදී මග හැරුණු යම් වැඩ කොටසක් හෝ අඩු පාඩුවක් ඇත්නම් මෙම වර්ෂයේදී එකී අඩුපාඩු මග හරවා ගනිමින් වඩාත් කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් සේවාලාභීන්ට සැපයීමට සියලු නිලධාරීන්ගේ සහයෝගය ඇතුව කැපවෙන බැව් වැඩි දුරටත් දන්වා සිටිමි.

**2018.01.01 – 2018.12.31 දක්වා සිද්ධස්ථානවල පඩුරු මුදල් ඉවත් කිරීම සඳහා සහභාගි වූ වාර ගණන සහ වර්ෂය තුළ ලැබුණු ආදායම**

| අනු අංකය | සිද්ධස්ථාන | වාර ගණන | වර්ෂය තුළ මුදල් එකතුව |
|---|---|---|---|
| **01** | ශ්‍රී දළදා මාළිගාව | **49** | **33,997,985.00** |
| **02** | මහනුවර විෂ්ණු දේවාලය | **04** | **1,340,350.00** |
| **03** | අලුත් නුවර දැඩිමුණ්ඩ දේවාලය | **05** | **5,726,850.00** |
| **04** | මහනුවර කතරගම දේවාලය | **11** | **2,835,140.00** |
| **05** | මහනුවර පත්තිනි දේවාලය | **11** | **4,116,689.00** |
| **06** | දොඩන්වල නාථ දේවාලය | **05** | **627,169.00** |
| **07** | ඇම්බැක්ක කතරගම දේවාලය | **03** | **784,265.00** |
| **08** | මහනුවර නාථ දේවාලය | **01** | **246,650.00** |
| **09** | රංගිරි දඹුලු රජමහා විහාරය | **02** | **2,787,117.00** |
| **10** | ගැටඹේ රාජෝපවනාරාමය | **11** | **4,849,660.00** |
| **11** | මුතියංගණ රජමහා විහාරය | **02** | **1,080,610.00** |
| **12** | මහියංගණ රජමහා විහාරය | **02** | **446,077.00** |
| **13** | මහියංගණ සමන් දේවාලය | **03** | **2,662,880.00** |
| **14** | මාතලේ අලුවිහාරය | **02** | **269,527.00** |
| | | | |
| **15** | හඟුරන්කෙත විෂ්ණු දේවාලය | **01** | **275,738.00** |

| | | | |
|---|---|---|---|
| 16 | මැදගොඩ පත්තිනි දේවාලය | 01 | 154,009.00 |
| 17 | ලංකාතිලක විෂ්ණු දේවාලය | 01 | 278,840.00 |
| 18 | ගඩලාදෙණිය විෂ්ණු දේවාලය | 01 | 37,317.00 |
| | මුළු එකතුව | 115 | 62,516,873.00 |

**2018.01.01 -2018.12.31** දක්වා විභාග වෙමින් පවතින නඩු

| අනු අංකය | නඩු අංකය | අධිකරණය | අදාළ සිද්ධස්ථාන |
|---|---|---|---|
| 01 | **DLM 000982/11** | මහනුවර දිසා අධිකරණය | සුදුහුම්පොල රජමහා විහාරය |
| 02 | **20381/L** | මහනුවර දිසා අධිකරණය | දලුක්ගොල්ල රජමහා විහාරය |
| 03 | **L 21455** | මහනුවර දිසා අධිකරණය | ගංගාරාම රජමහා විහාරය |
| 04 | **DLM 1306/12** | මහනුවර දිසා අධිකරණය | ශ්‍රී සිංහල සීමාරාමය |
| 05 | **DLM 00048/14** | මහනුවර දිසා අධිකරණය | අලවතුගොඩ සඳගිරි විහාරය |
| 06 | **P 14891** | මහනුවර දිසා අධිකරණය | මීගම්මන රජමහා විහාරය |
| 07 | **L 17925** | මහනුවර දිසා අධිකරණය | දලුක්ගොල්ල රජමහා විහාරය |
| 08 | **DLM 125/17** | මහනුවර දිසා අධිකරණය | ඉල්ලදොර රජමහා විහාරය |
| 09 | **L/ 25984 /L** | අවිස්සාවේල්ල දිසා අධිකරණය | පැලැල්ලේගම පත්තිනි දේවාලය |
| 10 | **M/ 24342** | අවිස්සාවේල්ල දිසා අධිකරණය | පැලැල්ලේගම පත්තිනි දේවාලය |

| අනු අංකය | නඩු අංකය | අධිකරණය | අදාළ සිද්ධස්ථාන |
|---|---|---|---|
| 01 | **X 212** | හැටන් දිසා අධිකරණය | ශ්‍රී මෙත්තාරාම විහාරය |

**2018.12.31** වන විට අවසන් වූ නඩු

| | | |
|---|---|---|
| 01. නිකුත් කර ඇති බදු අයදුම් පත් සංඛ්‍යාව | - | 934 |
| 02. අවසන් කර ඇති බදු ඔප්පු සංඛ්‍යාව | - | 235 |
| 03. තක්සේරු සඳහා යවා ඇති ලිපි ගණන | - | 180 |
| 04. ක්ෂේත්‍ර පරික්ෂණ ගණන | - | 51 |
| 05. කාර්යාල පරික්ෂණ ගණන | - | 77 |
| 06. විහාරාධිපති තහවුරු කිරීම් ලිපි | - | 06 |
| 07. භාරකරුවන් පත් කිරීමේ සංඛ්‍යාව | - | 12 |
| 08. බස්නායක නිළමේවරු පත් කිරීම | - | - |
| 09. භාණ්ඩ භාර දීම | - | 06 |
| 10. මුදල් නිදහස් කළ සංඛ්‍යාව | - | 43 |
| 11. ගස් කැපීම | - | 133 |
| 12. ශ්‍රමදාන | - | 04 |
| 13. පඩුරු මුදල් රාජකාරි අවස්ථා | - | 115 |
| 14. විභාගවෙමින් පවතින නඩු | - | 10 |
| 15. 2018.12.31 වන විට අවසන් වූ නඩු | - | 01 |